අ.පො.ස. (උ.පෙළ) විභාගය/க.பொ.த. (உயர் தர)ப் பரீட்சை

විෂය අංකය / பாட இலக்கம்: 23

විෂයය / பாடம்: දේශපාලන විද්‍යාව

## ලකුණු දීමේ පටිපාටිය/புள்ளி வழங்கும் திட்டம்

### I පත්‍රය/பத்திரம் I

| ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. |
|---|---|---|---|---|---|
| 01. | 4 | 11. | 4 | 21. | 5 |
| 02. | 4 | 12. | 1 | 22. | 3 |
| 03. | 3 | 13. | 2 | 23. | 5 |
| 04. | 1 | 14. | 1 | 24. | 2 |
| 05. | 3 | 15. | 2 | 25. | 3 |
| 06. | 2 | 16. | 3 | 26. | 4 |
| 07. | 1 | 17. | 2 | 27. | 2 |
| 08. | 4 | 18. | 5 | 28. | 1 |
| 09. | 4 | 19. | 4 | 29. | 5 |
| 10. | 5 | 20. | 3 | 30. | 3 |

එක් පිළිතුරකට/ ஒரு சரியான விடைக்கு ලකුණු 02 බැගින්/புள்ளி வீதம்

අවසාන ලකුණු/மொத்தப் புள்ளிகள் $2 \times 30 = 60$

## B කොටස කෙටි පිළිතුරු

**31. දේශපාලනය සහ දේශපාලන විද්‍යාව අතර සම්බන්ධය දැකිය හැකි පැති දෙක නම් කරන්න.**

i. දේශපාලනය කිරීම
ii. දේශපාලනය හැදෑරීම

**32. ආණ්ඩුකරණ ක්‍රියාවලියේ කාර්යයන් කිහිපයක් තිබේ. ඒවා අතුරින් දෙකක් නම් කරන්න.**

i. නීති සම්පාදනය
ii. ප්‍රතිපත්ති සම්පාදනය
iii. ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම හා රාජ්‍ය පරිපාලනය
iv. නීතිය හා සාමය පවත්වා ගැනීම
v. ගැටුම් කළමනාකරණය
vi. අන්තර් රාජ්‍ය සම්බන්ධතා පවත්වා ගැනීම

**33. දේශපාලන විද්‍යා අධ්‍යයනයෙහි දාර්ශනික/ප්‍රතිමානීය ප්‍රවේශයේ පුරෝගාමී චින්තකයින් දෙදෙනා නම් කරන්න.**

i. ප්ලේටෝ
ii. ඇරිස්ටෝටල්

**34. නූතන කොමිස රාජ්‍යය ප්‍රධාන මූලධර්ම/අංග හතරක් යටතේ සංවිධානය කර තිබේ. ඉන් දෙකක් නම් කරන්න.**

i. නිශ්චිත දේශ සීමාව / භූමිය
ii. ජාතික පදනම / ජාතිකත්වය
iii. ආණ්ඩුව
iv. ස්වාධිපත්‍යය / පරමාධිපත්‍යය

**35. (1) රාජ්‍යය සතු අධිකාරී බලය විස්තර කෙරෙන දේශපාලන විද්‍යා සංකල්පය කුමක් ද?**

i. පරමාධිපත්‍යය / ස්වාධිපත්‍යය
ii. ෆැසිස්ට්වාදය / නට්සිවාදය

**36. (1) 'පොදු කැමැත්ත' යන සංකල්පය ඉදිරිපත් කළ දේශපාලන චින්තකයා නම් කරන්න.**

රූසෝ

**(2) පශ්චාත් යටත්විජිත රාජ්‍යය යන සංකල්පය ඉදිරිපත් කළ න්‍යායවාදියා නම් කරන්න.**

හම්සා අලාවි

**37. රාජ්‍යයේ සම්භවය පිළිබඳ සමාජ සම්මුතිවාදී න්‍යාය ඉදිරිපත් කළ දේශපාලන දාර්ශනිකයින් දෙදෙනෙකු නම් කරන්න.**

i. තෝමස් හොබ්ස්
ii. ජෝන් ලොක්
iii. රූසෝ
iv. ඉම්මැනුවෙල් කාන්ට්

**38. විධායක බලය සංවිධානය වී ඇති ආකාරය පිළිබඳ කෙරෙන ආණ්ඩුක්‍රම ආකෘති හතරක් තිබේ. ඉන් දෙකක් කරන්න.**

i. පාර්ලිමේන්තු ක්‍රමය
ii. ජනාධිපති ක්‍රමය
iii. අර්ධ ජනාධිපති ක්‍රමය
iv. ද්විත්ව විධායක ක්‍රමය / දෙමුහුන් ක්‍රමය
v. ඒක තන්ත්‍ර ක්‍රමය

**39. (1) රාජ්‍යය ආගම සමඟ අනන්‍ය නොවිය යුතු බව ප්‍රකාශ කරන දේශපාලන මතවාදය කුමක් ද?**

i. නිරාගමිකවාදය / අනාගමිකවාදය / ලෝකායතවාදය / ලිබරල් නිරාගමිකවාදය
ii. මාක්ස්වාදය / සමාජවාදය / කොමියුනිස්ට්වාදය

**40. (1) [illegible] යුරෝපයේ සෘජු ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාවට නැංවූයේ කුමන රටේ ද?**

i. ග්‍රීසිය / ග්‍රීක පෞර රාජ්‍යය

**(2) බ්‍රිතාන්‍යයේ සර්ව ජන ඡන්ද බලය හඳුන්වා දෙන ලද්දේ කවර වසරේ ද?**

ii. 1928

**41. (1) ඉන්දියාවේ සංඝීය ඒකක හඳුන්වන්නේ කුමන නමකින් ද?**

ප්‍රාන්ත රාජ්‍ය / ප්‍රාන්ත

**(2) ස්විට්සර්ලන්තයේ සංඝීය ඒකක හඳුන්වා ඇත්තේ කුමන නමකින් ද?**

කැන්ටන්

**42. (1) සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ශ්‍රී ලංකාවට හඳුන්වා දුන්නේ ඒක-මණ්ඩල ව්‍යවස්ථාදායකයක් ද? ද්වි-මණ්ඩල ව්‍යවස්ථාදායකයක් ද?**

ද්වි - මණ්ඩල ව්‍යවස්ථාදායකයකි

**(2) ශ්‍රී ලංකාවට සමානුපාතික නියෝජනය හඳුන්වා දෙන ලද්දේ කුමන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ද?**

1978 ව්‍යවස්ථාව / දෙවන ජනරජ ව්‍යවස්ථාව

**43. ශ්‍රී ලංකාවේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ජනාධිපතිවරයාගේ බලතල වැඩිකරන ලද ව්‍යවස්ථා සංශෝධන දෙක නම් කරන්න.**

1, 2, 3, 4, 8

3 වැනි සංශෝධනය
18 වැනි සංශෝධනය
20 වැනි සංශෝධනය

**44. (1) පන්ති ගැටුම සමාජ ප්‍රගතියේ ගාමක බලවේගය යැයි හැඳින්වෙන්නේ කවර දේශපාලන න්‍යායයෙහි ද?**

මාක්ස්වාදය / සමාජවාදය

**(2) ගැටුම්වල සාධනීය කාර්යයන් ගණනාවක් පවතින බව ප්‍රකාශ කළ සමාජ විද්‍යාඥයකු නම් කරන්න.**

කාල් මාක්ස් / ලුවිස් කෝසර් / ජෝර්ජ් සිමෙල්

[illegible]

**45. ඉන්දියානු නිරාගමිකවාදී සංකල්පයේ අර්ථ දෙකක් තිබේ. ඒවා කවරේ ද?**

i. සර්වධර්ම සමභාව - සෑම ආගමකටම එක සමානව සැළකීම.
ii. ධර්ම නිරපේක්ෂතා - ආගමික අපක්ෂපාතී බව, සෑම ආගමකටම අපක්ෂපාතව සැළකීම.

**46. දේශපාලන ව්‍යාපාරයක් ලෙස ජාතිකවාදයේ ප්‍රධාන ස්වරූප දෙකක් තිබේ. ඒවා මොනවා ද?**

i. ජාතික - රාජ්‍ය ජාතිකවාදය
ii. ජනවාර්ගික ජාතිකවාදය

**47. (1) ජාතිකවාදය පිළිබඳ ව *Imagined Communities* (පරිකල්පිත ප්‍රජාවන්) නම් කෘතිය ලියූ න්‍යායවේදියා නම් කරන්න.**

බෙනඩික්ට් ඇන්ඩර්සන්

**(2) පුරවැසියන් සක්‍රිය ලෙස දේශපාලන ක්‍රියාවලියට සහභාගී විය යුතු බව ප්‍රකාශ කළ සම්භාව්‍ය දේශපාලන චින්තකයා කවුරුන් ද?**

ඇරිස්ටෝටල්

**48. ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තියට බලපාන සාධක දෙකක් නම් කරන්න.**

i. භූ දේශපාලන පිහිටීම
ii. සමාජ සහ සංස්කෘතික සාධක
iii. දේශපාලන ආර්ථිකය
iv. පාලන තන්ත්‍රයේ දේශපාලන අභිලාෂ
v. කලාපීය සහ ජාත්‍යන්තර බල තුලනය
vi. ජන සමාජයේ අපේක්ෂා සහ දෘෂ්ටීන්

**49. (1) නිදහසින් පසු ශ්‍රී ලංකාවේ පුරවැසි පනත හඳුන්වා දුන් ආණ්ඩුව කුමක් දැයි නම් කරන්න.**

1947 ආණ්ඩුව, 1947 එ.ජා.ප ආණ්ඩුව, 1947 ඩී.එස්. සේනානායක ආණ්ඩුව

**(2) සිංහල භාෂාව ශ්‍රී ලංකාවේ රාජ්‍ය භාෂාව බවට පත් කළේ කවර ආණ්ඩුව ද?**

1956 මහජන එක්සත් පෙරමුණු ආණ්ඩුව / මහජන එක්සත් පෙරමුණු ආණ්ඩුව / 19
බණ්ඩාරනායක ආණ්ඩුව

**50. 2015 'යහපාලනය' සහාග ආණ්ඩුව විසින් හඳුන්වාදෙන ලද ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රතිසංස්කරණ පියවර දෙකක් නම් කරන්න.**

i. 19 වැනි සංශෝධනය.
ii. ස්වාධීන කොමිෂන් සභා පිහිටුවීම.
iii. තොරතුරු දැන ගැනීමේ නීතිය පැණවීම හා කොමිෂන් සභාව පිහිටුවීම.
iv. ජනාධිපති ධූරයේ බලතල අඩුකිරීම.
v. පාර්ලිමේන්තුවේ බලය වැඩිකිරීම.
vi. අධිකරණයේ ස්වාධීනත්වය තහවුරු කිරීම
vii. ව්‍යවස්ථාදායක සභාව පිහිටුවීම.

# I කොටස

**1. දේශපාලනය හැදෑරීමේ විද්‍යාත්මක ප්‍රවේශය විස්තර කරන්න.** (ලකුණු 20)

**<u>අරමුණ</u>**

මෙම ප්‍රශ්නයෙහි අරමුණ වන්නේ දේශපාලන විද්‍යාව හැදෑරීමට භාවිත කරන විද්‍යාත්මක ප්‍රවේශයෙහි ස්වභාවය, එය බිහිවීමේ පසුබිම, සහ එයට පදනම් වන මූලධර්ම පිළිබඳව අපේක්ෂකයින් සතු දැනුම පරීක්ෂා කිරීමයි.

**<u>පිළිතුරෙහි අන්තර්ගතය</u>**

**හැඳින්වීම (ලකුණු 02)**

දේශපාලන විද්‍යා අධ්‍යයනය ප්‍රවේශ ගණනාවකින් සමන්විතය. සමහර ප්‍රවේශ සම්භාව්‍ය ග්‍රීක යුගයේ පටන් පැවති අතර, තවත් සමහර ඒවා වර්ධනය වූයේ විසිවැනි සියවසෙ හි ය. විද්‍යාත්මක ප්‍රවේශය එලෙස විසිවැනි සියවසෙ හි විකාශනය වූවකි. ඇමෙරිකානු දේශපාලන විද්‍යාඥයින් විසින් 1920 සහ 1930 ගණන් වලදී ආරම්භ කරන ලද එම එම ප්‍රවේශය, දේශපාලන අධ්‍යයනය නූතන ''සමාජීය විද්‍යාවක්'' බවට පරිවර්තනය කිරීමේ ප්‍රයත්නය හා සම්බන්ධ විය.

විෂය කරුණු

- දේශපාලන අධ්‍යනයේ විද්‍යාත්මක ප්‍රවේශය හා එහි ස්වභාවය
  - විද්‍යාත්මක ප්‍රවේශයෙහි අරමුණ වූයේ දේශපාලන අධ්‍යයනය ''විද්‍යාවක්'' බවට පත් කිරීමයි. ඒ සඳහා දේශපාලන සිද්ධීන් අධ්‍යයනය කිරීමට ස්වාභාවික විද්‍යාවන් විසින් භාවිතා කරන ලද විද්‍යාත්මක විධික්‍රමයට අනුව ගොඩ නගන ලද ප්‍රවේශයක් හඳුන්වා දෙනු ලැබිණි.
  - මෙය සමාජය අධ්‍යයනය කිරීට, ස්වාභාවික විද්‍යා විධික්‍රමය යොදා ගනිමින් ''සමාජීය විද්‍යා'' ගොඩනැගීමේ ප්‍රයත්නයේම කොටසක් ද විය.

පසුබිම

- දේශපාලන අධ්‍යයනය විද්‍යාවක් බවට පත් කිරීමට පසුබිම් වූයේ සාම්ප්‍රදායිකව පැවති දාර්ශනික සහ ඓතිහාසික ප්‍රවේශ පිළිබඳව ඇමරිකාවේ ප්‍රධාන පෙළේ දේශපාලන විද්‍යාඥයින් අතර පැවති අතෘප්තිය සහ විවේචනයි. එම සාම්ප්‍රදායික ප්‍රවේශ යල් පැනගිය ඒවා බවත්, ඒවා මගින් දේශපාලනය පිළිබඳව විශ්වාසය තැබිය හැකි සහ වාස්තවික දැනුමක් ගොඩ නැගිය නොහැකි බවත්, ඔවුහු තර්ක කළහ.
- මෙම ප්‍රයත්නවලට පදනම් වූ විශ්වාසයක් වූයේ සමාජය සහ දේශපාලනය පිළිබඳව වලංගු දැනුම නිර්මාණය කිරීමට නම්, දේශපාලන විද්‍යාඥයින් ද, ස්වාභාවික විද්‍යාඥයින් අනුගමනය කළ ''ආනුභාවික'' සහ විද්‍යාත්මක විධි ක්‍රමය අනුගමනය කළ යුතුය යන්නයි.

- 1930 ගණන් වලදී මෙම ප්‍රවේශය වර්ධනය වූ අතර, පසු කාලයේදී එය ලෝකයේ අනෙකුත් දේශපාලන විද්‍යාඥයින් අතර ද පැතිරී, එය දේශපාලන විද්‍යාවේ අධිපති ප්‍රවේශය බවට ද පත් විය.

## මූලධර්ම

➢ දේශපාලන විද්‍යාවේ අරමුණ විය යුත්තේ "ආනුභාවික පර්යේෂණ" වෙතින් ලබා ගන්නා කරුණු, සාක්ෂි සහ දත්ත මත පදනම් වූ විද්‍යාත්මක දැනුම නිර්මාණය කිරීමයි.

- ආනුභාවික විධික්‍රමයෙන් කෙරෙන්නේ, ක්ෂේත්‍ර පර්යේෂණ හෝ අත්හදා බැලීම් මගින් ගැටලුවක් පිළිබඳව සංඛ්‍යාත්මක දත්ත සොයා, ඒවා සංඛ්‍යා විද්‍යාත්මක විශ්ලේෂණයට ලක් කර, අධ්‍යයනයට පාත්‍ර වූ සංසිද්ධියෙහි චර්යාවේ රටා සහ ප්‍රවණතා නිරීක්ෂණය කිරීමයි.
- විද්‍යාත්මකව ගොඩ නගන සමාජ දේශපාලන ව්‍යුහය වාස්තවික විය යුතුය.
- එම දැනුම වටිනාකම් විනිශ්චයන්ගෙන්, එනම් පුද්ගලික විශ්වාස සහ අගතීන් වලින් ද තොර එකක් විය යුතුය. මෙය ස්වාභාවික විද්‍යාවන්ගෙන් සමාජීය විද්‍යාවන්ට පැමිණි මූල ධර්මයකි.

## විද්‍යාත්මක ප්‍රවේශය සහ චර්යාවාදය

- චර්යාවාදය, විද්‍යාත්මක දේශපාලන විද්‍යාවේ ප්‍රධාන ධාරාවයි.
- සමාජ කණ්ඩායම්වල නොව, තනි පුද්ගලයන්ගේ දේශපාලන චර්යාව අධ්‍යයනය කිරීම එහි ප්‍රධාන විද්‍යාත්මක ප්‍රස්තුතය විය.
- 1920 ගණන් වලදී ආරම්භ වූ චර්යාවාදය, 1930 සහ 1940 ගණන් වලින් පසුව දේශපාලන විද්‍යාවට විශාල බලපෑමක් සිදුකළේය. එබැවින් එම බලපෑම හැඳින්වෙන්නේ "චර්යාවාදී විප්ලවය" යනුවෙනි.
- චර්යාවාදී ප්‍රවේශයේ ප්‍රධාන තර්කය වන්නේ ආනුභාවික අධ්‍යයනයට ලක් කළ හැකි දේශපාලන ප්‍රපංචය/ සංසිද්ධිය වන්නේ සමාජ කණ්ඩායම් නොව, සමාජයේ තනි තනි පුද්ගලයින් දේශපාලන ක්‍රියාවලිය තුළ ක්‍රියා කරන ආකාරයයි.
- ආනුභාවික අධ්‍යයනයට ලක්කළ හැක්කේ තනි පුද්ගලයින්ගේ දේශපාලන චර්යාවයි. එයට නිදසුන් ඡන්ද දායකයින්ගේ මැතිවරණ චර්යාව, සහ ඡන්දය දීමේ ප්‍රවණතා සහ රටා යනාදියයි.

## නිගමනය (ලකුණු 02)

දේශපාලන විද්‍යා අධ්‍යයන විධික්‍රමය, එහි විෂය අන්තර්ගතය සහ න්‍යාය සම්බන්ධ ප්‍රධාන පෙළේ වෙනසක් විද්‍යාත්මක ප්‍රවේශය විසින් සළකුණු කරනු ලැබිණි. විසිවැනි සියවස මුලදී එය බිහිවූයේ දේශපාලන අධ්‍යයනයේ සාම්ප්‍රදායික ප්‍රවේශ ප්‍රතික්ෂේප කරමිනි. 1930 ගණන් වල සිට 1970 ගණන් දක්වා දේශපාලන විද්‍යාවේ අධිපති ප්‍රවේශය වූ එය, 1970 ගණන් වලින් පසු මහත් විවේචනයටත් පසුබෑමටත් ලක් විය. දේශපාලනය පිළිබඳ එය විසින් ඉදිරිපත් කරන ලද්දේ පටු දැක්මක්ය යන්න, ඒ පිළිබඳව මතු වූ ප්‍රධාන විවේචනය යි.

**2. 'දේශපාලන න්‍යාය' යනු කුමක් දැයි විස්තර කර, දේශපාලනය අධ්‍යයනය කිරීමේදී 'න්‍යාය' වැදගත් වන්නේ මන්දැයි සාකච්ඡා කරන්න.**

(ලකුණු 20)

අභිමතාර්ථය

මෙම ප්‍රශ්නයෙහි අරමුණ වන්නේ දේශපාලන න්‍යාය පිළිබඳ අපේක්ෂකයින්ගේ දැනුමත්, එහි ස්වභාවය හා ප්‍රයෝජනවත් බව පැහැදිලි කිරීමේ හැකියාවත් ඇගයීමට ලක් කිරීමයි.

**පිළිතුරෙහි විෂය කරුණු**

- දේශපාලන සහ සමාජීය විද්‍යා තුළ ''න්‍යාය'' යොදා ගැනෙන්නේ සමාජයේ සිදුවන සංසිද්ධීන්, එසේ සිදුවන්නේ මන්දැයි පැහැදිලි කිරීමේ සහ විග්‍රහ කිරීමේ විධි ක්‍රමික මෙවලමක් ලෙසය.
- විද්‍යාවේ න්‍යාය යන්නෙන් අදහස් වන්නේ කෙටි සංකල්පයක් බවට සූත්‍ර ගත කළ හැකි, හේතුඵල සම්බන්ධයේ තර්කණය මත ගොඩ නගන විද්‍යාත්මක ප්‍රකාශයකි.
- දේශපාලන න්‍යාය යනු දේශපාලන ක්ෂේත්‍රයේ සිදුවන සංසිද්ධීන් විග්‍රහ කිරීමට හා ඒවායේ හේතුඵල සම්බන්ධතාව පැහැදිලි කිරීමට දේශපාලන විද්‍යාඥයින් යොදා ගන්නා මෙවලමකි.
- දේශපාලන විද්‍යාවේ න්‍යාය යන සංකල්පයේ අර්ථ දෙකක් තිබේ. ඒවා නම් ප්‍රතිමානීය න්‍යාය සහ විද්‍යාත්මක න්‍යායයි.
- ප්‍රතිමානීය න්‍යාය සම්බන්ධ වී තිබෙන්නේ දේශපාලන දර්ශනය සහ දේශපාලන චින්තනය සමඟය. එය ග්‍රීක යුගයේ සිට සම්භාව්‍ය දේශපාලන චින්තනය සමඟ සම්බන්ධය. ආනුභවික දේශපාලන න්‍යාය සම්බන්ධ වන්නේ නූතන දේශපාලන විද්‍යාවටය.
- විද්‍යාත්මක න්‍යාය දේශපාලන හා සමාජ විද්‍යාවට පැමිණියේ ස්වාභාවික විද්‍යාවන්ගේ බලපෑම නිසාය. දේශපාලන විද්‍යාවේ විද්‍යාත්මක න්‍යාය ගොඩ නැගීම ආරම්භ වූයේ 1930 ගණන් වල පටන්ය.
- විද්‍යාත්මක සම්ප්‍රදාට අනුව න්‍යායේ කාර්යය වන්නේ ලෝකයේ සිදුවන දේවල් එසේ සිදුවන්නේ මන්දැයි පැහැදිලි කිරීමයි. එවැනි න්‍යායක් ''නීතියකට'' සමානය. විද්‍යාඥයින් තම පර්යේෂණ වලින් සිදුකරන්නේ එවැනි ''නීති'' වැනි ''න්‍යාය'' ගොඩ නැගීමයි.
- දේශපාලන විද්‍යාවේ ප්‍රතිමානීය සහ විද්‍යාත්මක න්‍යාය යන දෙකම භාවිතා වේ.
- දේශපාලන විද්‍යාව විවිධ න්‍යායික ක්ෂේත්‍ර ගණනාවකින් සමන්විතය. එවැනි ප්‍රධාන ධාරා වන්නේ ලිබරල්වාදී න්‍යාය, සමූහාණ්ඩුවාදී න්‍යාය, මාක්ස්වාදී න්‍යාය, පශ්චාත් මාක්ස්වාදී න්‍යාය, දේශපාලන - නවීකරණ න්‍යාය, ස්ත්‍රීවාදී න්‍යාය යන මේවායි.

3. (i) බලපෑම් කණ්ඩායම යනු මොනවා දැයි පැහැදිලි කරන්න. (ලකුණු 10)
(ii) අරමුණු සම්බන්ධයෙන් දේශපාලන පක්ෂ සහ බලපෑම් කණ්ඩායම් අතර ඇති වෙනස්කම් මොනවා දැයි සාකච්ඡා කරන්න. (ලකුණු 10)

**අභිමතාර්ථය**

මෙම ප්‍රශ්නයෙන් අපේක්ෂා කෙරෙන්නේ දේශපාලන පක්ෂ සහ බලපෑම් කණ්ඩායම් අතර ඇති වෙනස හඳුනාගෙන පැහැදිලි කිරීමට අපේක්ෂකයන් සතු දැනුම සහ හැකියාව ඇගයීමයි.

(ලකුණු 10)

**(i) බලපෑම් කණ්ඩායම් යනු මොනවා ද ?**

**පිළිතුරෙහි විෂය කරුණු**

- බලපෑම් කණ්ඩායම් යනු නීති රාජ්‍ය ප්‍රතිපත්ති සහ රජයේ තීරණ යන මේවාට බලපෑම් කිරීම අරමුණු කරගෙන ගොඩ නගා ඇති සංවිධානාත්මක පුරවැසි කණ්ඩායම්ය.
- අභිලාෂ කණ්ඩායම් සහ ලොබි කණ්ඩායම් යනු බලපෑම් කණ්ඩායම් වලට සමාන කාර්යයන් කරන සංවිධානය වූ පුරවැසි කණ්ඩායම් ය.
- බලපෑම්, අභිලාෂ සහ ලොබි කණ්ඩායම් දේශපාලන විද්‍යා අධ්‍යයනයට වැදගත් වන්නේ ඒවා නීති සම්පාදනයට, රාජ්‍ය ප්‍රතිපත්ති වලට, සහ ආණ්ඩුවේ තීරණ වලට බලපෑම් කරන දේශපාලන පක්ෂවලට සමාන්තරව පවතින ආයතන නිසා ය.
- මේවා විධිමත් සංවිධාන ද වෙති.
- එහෙත් බලපෑම් කණ්ඩායම් දේශපාලන පක්ෂ වලින් වෙනස් ය. එබැවින් දේශපාලනයේ දී ඉටු කෙරෙන කාර්යයන් වෙනස් ය.

(ii) අරමුණු සම්බන්ධයෙන් දේශපාලන පක්ෂ හා බලපෑම් කණ්ඩායම් අතර වෙනස්කම්

(ලකුණු 10)

- දේශපාලන පක්ෂ උත්සාහ ගන්නේ ආණ්ඩුව ඇතුළට ගොස් හැකිනම් ආණ්ඩුවලට ලබාගෙන රාජ්‍ය ප්‍රතිපත්ති යන බලපෑම් කිරීමටය. මෙම අරමුණින් ක්‍රියාකරන එකම පුරවැසි සංවිධානය දේශපාලන පක්ෂයි.
- බලපෑම් /අභිලාෂ / ලොබි කණ්ඩායම් වල අරමුණ වන්නේ ආණ්ඩු ඇතුළට නොගොස් ආණ්ඩුව පිටතින් සිට ආණ්ඩුවේ ප්‍රතිපත්ති සහ තීරණ වලට බලපෑම් කිරීමයි.
- බලපෑම් කණ්ඩායම්වලට සාමාන්‍යයෙන් තිබෙන්නේ තනි තේමාවක් සහිත න්‍යාය පත්‍රයි. දේශපාලන පක්ෂවලට ඇත්තේ පුළුල් න්‍යාය පත්‍රයි.
- දේශපාලන පක්ෂ මැතිවරණ ක්‍රියාවලියට සෘජුව සහභාගී වෙති. බලපෑම් කණ්ඩායම් එසේ නොවේ. එහෙත් ඒවා මැතිවරණ වලට සහභාගී වන දේශපාලන පක්ෂවලට සහ අපේක්ෂකයන්ට සහාය දෙන්නට පුළුවන.

## II කොටස

4. (i) ශ්‍රී ලංකාවේ 1833 කෝල්බෲක් - කැමරන් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණවල දේශපාලන ප්‍රතිඵල කෙටියෙන් දක්වන්න. (ලකුණු 10)

(ii) ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රමය සහ දේශපාලනය ප්‍රජාතන්ත්‍රීය කිරීමට ඩොනමෝර් ප්‍රතිසංස්කරණ විසින් සිදුකරන ලද දායකත්වය කුමක් දැයි පැහැදිලි කරන්න. (ලකුණු 10)

(i) 1833 කෝල්බෲක් - කැමරන් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණවල දේශපාලන ප්‍රතිඵල

(ලකුණු 10)

අරමුණ

මෙම ප්‍රශ්නයෙන් අපේක්ෂා කරන්නේ කෝලබෲක් කැමරින් ප්‍රතිසංස්කරණවල දේශපාලන ප්‍රතිඵල විස්තර කිරීමට අපේක්ෂකයන් සතු හැකියාව ඇගයීමයි. එබැවින් කෝල්බෲක් කැමරන් ප්‍රතිසංස්කරණය ගැන විස්තර පමණක් ඉදිරිපත් කරන පිළිතුරුවලට සම්පූර්ණ ලකුණු ප්‍රදානය කිරීමෙන් වළකින්න.

හැඳින්වීම (ලකුණු 01 යි)

ශ්‍රී ලංකාව 1815 දී සම්පූර්ණ යටත් කරගත් පසු සම්පූර්ණ දේශපාලන පරිපාලන සහ නෛතික ප්‍රතිසංස්කරණ දිවයිනෙහි ඇති කිරීමට බ්‍රිතාන්‍ය යටත් විජිත පාලකයින් ගත් පළමු වැනි ප්‍රයත්නය කෝබෲක් කැමරන් ප්‍රතිසංස්කරණවල ගැබ්වී තිබිණි. එබැවින් කොමිෂන් සභාවේ යෝජනාවල අරමුණවූයේද දිවයිනේ කල්පවත්නා වෙනස්වීම් ඇති කිරීමයි.

අන්තර්ගතය (ලකුණු 08 යි)

- යටත් විජිත ලංකාවේ අනාගත මධ්‍යගත රජයක් බිහි කිරීමට පදනම දැමීම සඳහා කෝල්බෲක් කැමරන් යෝජනාවලින් (අ) ලංකාව පරිපාලනමය වශයෙන් ඒකාබද්ධ කිරීම, සහ (ආ) ඒකාබද්ධ නෛතික හා අධිකරණ ක්‍රමයක් හඳුන්වාදීම සිදු විය.
- ලංකාවේ සාම්ප්‍රදායික පරිපාලන ක්‍රමයේ තිබුණු ජනවාර්ගික පදනම අවසන් කිරීම, මධ්‍යගත පරිපාලන ක්‍රමයක් තුළින් ලංකාව පරිපාලනමය වශයෙන් ඒකාබද්ධ කිරීමේ අරමුණ විය. පහතරට සිංහල උඩරට සිංහල සහ දෙමළ යනුවෙන් වූ සාම්ප්‍රදායික පරිපාලන ප්‍රදේශ අහෝසිකොට නව පරිපාලනමය පාලාත් ක්‍රමයක් ආරම්භ කරන ලද්දේ එබැවිනි. ඒ සමගම මුළු රටම එක් නීති ක්‍රමයක් යටතට ගෙන එන ලදී. දිවයින පරිපාලනමය වශයෙන් ඒකාබද්ධ කරමින් නව පාලාත් පහක් ඇති කරන ලද අතර ලංකාවේ පසු කාලීන මධ්‍යගත ඒකීය රාජ්‍ය ව්‍යුහයට පදනම වූයේ එම පරිපාලනමය ඒකාබද්ධ කිරීමයි.
- ඒකාබද්ධ නීති සහ අධිකරණ ක්‍රමයක් සඳහා වූ කැමරන්ගේ යෝජනාවල අරමුණවූයේ ද දිවයින පරිපාලනමය වශයෙන් ඒකාබද්ධ කිරීමයි. 1833 අධිකරණ ප්‍රඥප්තිය තුළින් කැමරන්ගේ ප්‍රතිසංස්කරණ

යෝජනා ක්‍රියාත්මක විය. කැමරන්ගේ තර්කය වූයේ ලංකාව පරිපාලනමය වශයෙන් ඒකාබද්ධ කිරීමට නම් එකම නීති ක්‍රමයක් ද තිබිය යුතුය යන්න.

- මෙම ප්‍රතිසංස්කරණවල පියවරක් ලෙස ආණ්ඩුකාරයාගේ නීති සම්පාදන බලය සීමා කිරීම සඳහා ව්‍යවස්ථාදායක සභාවක් පිහිටුවන ලදී. මේ මගින් සිදුවූයේ පළමුවරට සීමිත රාමුවක් තුළ නියෝජන මූලධර්මය හඳුන්වාදීමයි.
- අනාගත නියෝජන ආණ්ඩුක්‍රමයක් සඳහා මුලපිරීමේ දීර්ඝ ක්‍රියාවලියක් හා සම්බන්ධ වූ අනෙක් ප්‍රතිසංස්කරණ යෝජනාව නම්, ආණ්ඩුකාරයාගේ අත්තනෝමතික බලය සහ බලතල අඩු කිරීමේ පියවරක් වශයෙන් පරිපාලනයේ ආණ්ඩුකාරයාට උපදෙස් දෙන ව්‍යවස්ථාදායක සහ විධායක සභා පිහිටුවීමයි.
- ව්‍යවස්ථාදායක සභාව සාමාජිකයින් 15 ගෙන් සමන්විත විය යුතු විය. එය ලංකාවේ පසුව වර්ධනය වූ පාර්ලිමේන්තු ක්‍රමය සඳහා වූ පළමුවැනි පියවර ලෙස ද සැළකිය හැකිය.
- යටත් විජිත ආණ්ඩුවේ නීති සම්පාදන ක්‍රියාවලියට සහභාගීවීමේ ක්‍රියාවලියෙහි දොර දේශීය ප්‍රභූ පන්තියට විවෘත කිරීම ද කොල්බෲක් ප්‍රතිසංස්කරණ තුළින් සිදු විය. ව්‍යවස්ථාදායක සභාවට දේශීය නියෝජිතයින් තිදෙනෙකු පත් කිරීම මෙම ක්‍රියාවලියෙහි පළමු පියවර විය. ඔවුන් තිදෙනා ආණ්ඩුකාරයා විසින් නාමකරණයෙන් පත් කරන ලද අතර, ඔවුන් නියෝජනය කළේ සිංහල, දෙමළ සහ බර්ගර් යන ජන කණ්ඩායම්ය. මෙම ලංකාවේ වාර්ගීක නියෝජන ක්‍රමයෙහි ආරම්භය ද සළකුණු කළේය

- සිවිල් සේවයෙහි දොරටු දේශීය පුද්ගලයන්ට විවෘත කිරීම ද,යටත් විජිත පරිපාලනයට සම්බන්ධවීමට ස්වදේශිකයන්ට අවකාශ ලැබීමේ ක්‍රියාවලියක ආරම්භ විය. කෝල්බෲක් කොමිෂන් සභාවේ අදහස වූයේ දිවයින පරිපාලන කිරීමට දේශීය නියෝජිතයින් ද සම්බන්ධ කර ගැනීමයි.

නිගමනය (ලකුණු 01)

කෝල්බෲක් ප්‍රතිසංස්කරණවල අරමුණවූයේ ආණ්ඩුක්‍රම සහ පරිපාලන ප්‍රතිසංස්කරණ මගින් ලංකාවේ යටත්විජිත පාලන ක්‍රමය තහවුරු කිරීමයි. එම ප්‍රතිසංස්කරණ මගින් ලංකාවේ යටත් විජිත ආර්ථිකයක් ගොඩ නැගීමට ද පදනම වැටුණි. ඒ සමගම මෙම ප්‍රතිසංස්කරණවල අපේක්ෂිත ප්‍රතිඵලවලද ඇති විය. වැඩවසම් ආර්ථික හා දේශපාලන සම්බන්ධතා දුර්වල වී අහෝසි වීම ඒ අතරින් ප්‍රධාන එකකි. ඒවා සාධනීය ප්‍රතිඵල වන අතර, අපට ඒවා පෙනෙන්නේ ඒවා පිළිබඳ දීර්ඝකාලීන දෘෂ්ටි කෝණයකින් බලන විටය.

(ii) **ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රමය හා දේශපාලනය ප්‍රජාතන්ත්‍රීය කිරීමට ඩොනමෝර් ප්‍රතිසංසකරණ සිදු කළ දායකත්වය** (ලකුණු 10)

මෙම ප්‍රශ්නයෙහි අරමුණ, ඩොනමෝර් ප්‍රතිසංස්කරණවල තිබූ ප්‍රජාත්‍රන්ත්‍රීයකරණ ප්‍රතිඵල විස්තර කිරීමට සහ ඒවා ඇගයීමට ලක් කිරීමට අපේක්ෂකයින් සතු හැකියාව පරීක්ෂා කිරීමයි.

හැඳින්වීම (ලකුණු 01 යි)

1931 ඩොනමෝර් ප්‍රතිසංස්කරණවලින් සිදු වූයේ, යටත් විජිත ලංකාවේ වගකීම් සහගත ආණ්ඩුක්‍රමයකට පදනම දැමීමයි. අධ්‍යාපනය, දේපොළ හිමිකම හෝ ස්ත්‍රී පුරුෂ භේදයක් නොමැති

සෑම වැඩිහිටියෙකුම ඡන්දබලය ලබාදීම මගින් යටත් විජිත පරිපාලන ක්‍රමය ප්‍රජාතන්ත්‍රීය කිරීම ද ඒ මගින් අපේක්ෂා කෙරෙණි. එලෙස යටත් විජිත ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රමය, දේශපාලනය හා සමාජය ප්‍රතිසංස්කරණය කිරීම ඒ මගින් අපේක්ෂා කෙරිණි.

අන්තර්ගතය (ලකුණු 08 යි)

ප්‍රධාන විෂය කරුණු

ඩොනමෝර් ප්‍රතිසංස්කරණ යෝජනාවල ප්‍රධාන ඒවා සාරාංශ කර ඉන්පසුව ඒවායේ ප්‍රජාතන්ත්‍රීකරණ ප්‍රතිඵල පෙන්වා දීමෙන් පිළිතුර ගොඩ නැගිය හැකිය.

- **සර්ව ඡන්ද බලය :**

  වයස 21 ට වැඩි පිරිමින් සහ ගැහැණුන්ට වෙනස්කම් කිරීමකින් තොරව ඡන්දබලය ලබා දීමෙන් අරමුණු කරන ලද්දේ මහජනතාවට වගකියන සහ මහජනතාව තෝරා ගන්නා නියෝජිතයින්ගෙන් සමන්විත ආණ්ඩුක්‍රමයක් ලංකාවට හඳුන්වාදීම.

- **රාජ්‍ය මන්ත්‍රණ සභාව :**

  ඒතෙක් පැවති ව්‍යවස්ථාදායක මණ්ඩලය අහෝසිකර, ඒ වෙනුවට රාජ්‍ය මන්ත්‍රණ සභාව පිහිටුවන ලදී. නව ක්‍රමය යටතේ රාජ්‍ය මන්ත්‍රණ සභාවට මන්ත්‍රීවරුන් 61 ක් සිටි අතර, ඉන් 50ක් මහජන ඡන්දයෙන් තෝරා පත් කර ගනු ලැබූ අයයි. ඉතිරි මන්ත්‍රීවරුන්ගෙන් අට දෙනෙකු ආණ්ඩුකාරයා විසින් පත් කරන ලද අතර, අනෙක් තුන්දෙනා නිලලත් මන්ත්‍රීවරු වූහ. රජ්‍ය මන්ත්‍රණ සභාවේ කථානායකවරයා මන්ත්‍රීවරුන්ගෙන් පත්කරනු ලැබිණි. මෙය ලංකාවේ 1947 දී ආරම්භ වූ පාර්ලිමේන්තු ක්‍රමයේ ආරම්භයකි.

- **ප්‍රාදේශීය නියෝජනය :**

  ඒතෙක් පැවති වාර්ගික නියෝජන ක්‍රමය අහෝසි කරන ලද අතර, ඩොනාමෝර් කොමසාරිස්වරු එම ක්‍රමය තද බල විවේචනයකට ලක් කළහ. ඔවුන් එය හැඳින්වූයේ ලංකාවේ දේශපාලන දේහයේ වැළඳී තිබුණු පිළිකාවක් ලෙසය. එම ක්‍රමය වෙනුවට ඡන්දදායක කොට්ඨාශ මත පදනම් වූ නියෝජනය ක්‍රමය හඳුන්වා දෙන ලදී.

- **විධායක කාරකසභා ක්‍රමය :**

  විධායක කාරක සභා ක්‍රමයද වැදගත් ප්‍රතිසංස්කරණයක් වූ අතර, එය හඳුන්වා දෙන ලද්දේ කැබිනට් ක්‍රමය වෙනුවට ය. රාජ්‍යමන්ත්‍රණ සභාවේ කථානායකවරයා සහ නිලලත් මන්ත්‍රීවරුන් හැර අන් සියලු නියෝජිතයෝ විධායක කාරක සභා හතකට බෙදන ලදහ. මෙම කමිටුවලට භාර දෙන ලද්දේ ආණ්ඩුවේ විධායක වගකීම් ය. මහජන ඡන්දයෙන් පත් වූ මන්ත්‍රීවරුන්ට විධායක වගකීම් හා බලතල පැවරීම නිසා මහජන නියෝජිතයින්ට ව්‍යවස්ථාදායක මෙන්ම විධායක ක්ෂේත්‍රයෙහි ද වගකීම් දැරීමට අවකාශය ලැබිණ.

**ප්‍රජාතන්ත්‍රීකරණය :**

- සර්ව ජන ඡන්ද බලය හඳුන්වා දීම, ඩොනමෝර් ප්‍රතිසංස්කරණ විසින් ලංකාවේ ප්‍රජාතන්ත්‍රීය වර්ධනයට වැඩිම දායකත්වය සිදු කරන ලද ප්‍රතිසංස්කරණ පියවරයි. එය ලංකාවේ දේශපාලනික ක්‍රමය ප්‍රජාතන්ත්‍රීය කිරීමට තුඩු දුන්නේය. තම පාලකයින්ට රට පාලනය කිරීමට බලය පවරන්නේ තමන්ය යන හැඟීම මහජනතාව තුළ ඇති විය. තමන් තෝරා පත් කර ගත් ඡන්ද දායකයින්ට මහජනතාවටත් වගකීමට සිදුවන බවට පාලකයෝ තේරුම්ගත්හ. තමන් මහජනතාවගේ අපේක්ෂා ඉටු නොකළහොත් ජනතාව විසින් තමන් ඊළඟ මැතිවරණයේදී ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි බව පාලකයෝ ඉගෙන ගත්හ. මෙයින් සිදු වූයේ දේශපාලකයින් ද ප්‍රජාතන්ත්‍රවාදී වගවීමට යටත්වන බව තේරුම් ගැනීමයි.
- ඩොනමෝර් ආණ්ඩු ක්‍රමය යටතේ දේශපාලන පක්ෂ ක්‍රමයක් වර්ධනය වී තිබුණේ නැත. පක්ෂ ක්‍රමයක් වර්ධනය වීමට අවශ්‍ය අනුබලය ද ඒ වෙතින් නොලැබිණි. එසේ වුවත්, සර්ව ජන ඡන්ද බලයේ ප්‍රතිඵලයක් ලෙස පක්ෂ ක්‍රමය පසු කාලයේදී වර්ධනය විය.
- මහජනතාව දේශපාලන වශයෙන් සවිබල ගැන්වීම, ඩොනමෝර් ක්‍රමය යටතේ සිදු වූ තවත් වැදගත් ප්‍රජාතන්ත්‍රීය වර්ධනයකි. මෙය ප්‍රධාන වශයෙන් නියෝජනය ආණ්ඩු ක්‍රමයේ සහ සර්ව ජන ඡන්ද බලයේ ප්‍රතිඵලයකි. විශේෂයෙන් ආන්තිකකරණයට ලක්වී තිබුණු වාර්ගික සහ සමාජ කණ්ඩායම්වලට තම නිදහස සහ විමුක්තිය පිළිබඳ අවබෝධයක් සහ හැඟීමක් ලැබුණේ ඒ වෙතිනි.
- ශ්‍රී ලංකාවේ නූතන සුභ සාධක රාජ්‍ය බිහිවීම ද ඩොනමෝර් ආණ්ඩුක්‍රමයේ ප්‍රතිඵලයකි. රාජ්‍ය මන්ත්‍රණ සභාවට ඡන්දයෙන් තේරී පත් වූ මන්ත්‍රීවරු තම ඡන්දදායකයින්ට සේවය කිරීමට විවිධ සුභ සාධන ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවූහ.

මන්ත්‍රණ සභාවේ ...

විවිධ සුභ සාධන ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවූහ.

- ඩොනමෝර් ආණ්ඩු ක්‍රමය යටතේ තිබී විධායක කාරක සභාවල සභාපතිවරුන්ගේ සමන්වි අමාත්‍ය මණ්ඩලය පසු කාලයේ හඳුන්වා දෙන ලද. කැබිනට් ක්‍රමයෙහි ආරම්භක අවස්ථා විය. එය ලංකාවේ කැබිනට් ආණ්ඩුක්‍රමයෙහි ප්‍රථම පියවරයි.
- රාජ්‍ය මන්ත්‍රණ සභා ක්‍රමයෙහි අනපේක්ෂිත සාධනීය ප්‍රතිඵලයක් තිබිණි. දේශපාලන පක් ක්‍රමයක් නොතිබුණ නිසා තනි පුද්ගල මන්ත්‍රීවරුන්ට වැදගත් තැනක් ලැබිණ. සෑම විධා කාරක සභා සමාජික මන්ත්‍රීවරයෙක්ම ව්‍යවස්ථාදායක මෙන්ම විධායක කාර්යයන්ට ද සහභා වූහ. ඇවින් රාජ්‍ය මන්ත්‍රණ සභාව එහි මන්ත්‍රීවරුන් වූ ස්වදේශීය දේශපාලකයින් ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලනයත්, පරිපාලනයත් සම්බන්ධ අත්දැකීම් සහ පුහුණුව ලැබිණි.
- සුළු ජාතික නියෝජිතයින්ට, රාජ්‍ය මන්ත්‍රණ සභාවේ නියෝජනය ලැබිණි. එහෙත් ප්‍රදේශී නියෝජනය මත සකස් වූ නව මැතිවරණ ක්‍රමය සුළු ජාතීන්ට ප්‍රමාණවත් නියෝජන සහතික නොකිරීම නිසා දෙමළ සහ මුස්ලිම් නායකයෝ කණස්සලට පත් වී සිටියහ. රාජ මන්ත්‍රණ සභාවේ සිංහල බහුතරයක් පැවතීම සහ අමාත්‍ය මණ්ඩලයේ සුළුතර ජාතීන්ගේ නියෝජිතයක් නොවීමද නිසා ජනවාර්ගික අවිශ්වාසය තවත් තියුණුවීම මේ කාලයේදී සි විය.
- සිවිල් සාමාජය සහ සිවිල් සමාජ ක්‍රියාකාරීත්වය වඩාත් පුළුල්වීම ඩොනමෝර් යුගයේ සිදු තවත් වැදගත් ප්‍රජාතාන්ත්‍රික වර්ධනයකි.

**නිගමනය (ලකුණු 01)**

ඩොනමෝර් ආන්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණවලින් ලංකාවේ දේශපාලන පරිවර්තනයේ නව නැඹුරුවක් සළකුණු කරන ලද අතර, ඒ මගින් ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රමයක් සඳහා පදනම දැමිණි. 1947 න් පසු ලංකාවේ සිදුවූ වේගවත් දේශපාලන පරිවර්තනවලට පසුබිම සහ පදනම සකස් කරන ලද්දේ මෙම වෙනස් වීම් විසිනි.

**5. සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අහෝසි කිරීම සඳහා තුඩුදුන් හේතු සාධක පැහැදිලි කරන්න.**

**(ලකුණු 20)**

අභිමතාර්ථය

මෙම ප්‍රශ්නයෙහි අරමුණ වන්නේ නිදහසින් පසු කාලයේදී ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වූ සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අහෝසි කිරීමට තුඩුදුන් පසුබිම, සන්දර්භය සහ හේතු පිළිබඳව අපේක්ෂකයින් සතු දැනුමත් ඒවා විස්තර කිරීමට ඔවුන් සතු නිපුණතාවය පරීක්ෂා කිරීමයි.

හැඳින්වීම (ලකුණු 02)

සෝල්බරි ව්‍යවස්ථාව 1947 දී හඳුන්වා දෙන ලද්දේ ඩොනමෝර් ආණ්ඩුක්‍රමයේ අඩුපාඩුවලට පිළියම් යෙදීමට සහ ලංකාවට ලැබීමට නියමිත වූ නිදහස සහ ඩොමිනියන් තත්ත්වයට ගැලපෙන ආණ්ඩුක්‍රමයක් නිර්මාණය කිරීමටය. එම ව්‍යවස්ථාව විසින් ලංකාවට හඳුන්වා දෙන ලද්දේ පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය මත පදනම් වූ වෙස්ට්මින්ස්ටර් සම්ප්‍රදායට අයත් ආන්ඩුක්‍රමයකි. 1970 සමගි පෙරමුණු ආණ්ඩුව විසින් එය අහෝසි කරන ලද්දේ වාමාංශික සහ සිංහල ජාතිකවාදී දේශපාලන බලවේගවල විවේචන මැද්දේය. ඔවුන්ගේ ප්‍රධාන ඉල්ලීමක් වූයේ ලංකාවට සම්පූර්ණ ස්වාධිපත්‍යය ලබා ගැනීම සහ ලංකාව ජනරජයක් කිරීමයි. 1972 නව ව්‍යවස්ථාවෙන් මෙම ඉල්ලීම් ඉටු කෙරිණි.

අන්තර්ගතය (ලකුණු 16)

පිළිතුරෙහි මෙම ප්‍රධාන කොටසෙහි පහත සඳහන් විෂය කරුණු විස්තරාත්මකව සාකච්ඡා කළ හැකිය.

- නිදහස ලැබීමෙන් පසුව ශ්‍රී ලංකාව තවදුරටත් බ්‍රිතාන්‍ය කිරීටයට යටත්ව නොපැවතිය යුතු යුතුය යන අදහස ප්‍රබල ලෙස මතු වී තිබිණි.
- රටේ දේශපාලන බලවේග අතර, පුළුල් ලෙස පැතිරූ තිබුණු මතයක් නම් සෝල්බරි ව්‍යවස්ථාවෙන් ශ්‍රී ලංකාව පූර්ණ නිදහස ලබාදී තිබුණේ නැත යන්නයි.
- සෝල්බරි ව්‍යවස්ථාවෙන් නිර්මාණය කළ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවට නීති සම්පාදනය කිරීමේ උත්තරීතර බලය නොලැබිණි. එයට ප්‍රධාන තර්කය වූයේ ව්‍යවස්ථාවේ 29(2) වගන්තිය අහෝසි කිරීමේ බලය ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවට නොතිබීමයි. එමෙන්ම සෝල්බරි ව්‍යවස්ථාව සංශෝධනය කිරීමේ බලය ද පාර්ලිමේන්තුවට නොතිබිණි. තවත් තර්කයක් වූයේ ව්‍යවස්ථාදායක බලය රජිණ (අග්‍රාණ්ඩුකාරයා) නියෝජිත මන්ත්‍රී මණ්ඩලය සහ සෙනෙට් සභාව අතර බෙදී ගිය නිසා මහජන නියෝජිතයන් සතු ව්‍යවස්ථාදායක බලය සීමා වී

- සිංහල භාෂාට සහ බුද්ධාගමට ප්‍රමුඛස්ථානය ලබා දෙන නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්පාදනය කිරීම සඳහා තිබූ ජාතිකවාදී ඉල්ලීම්
- 1947 ස්වාධීනතා පණතට අනුව, ලංකාවේ ඉල්ලීම පරිදි ලංකාව සඳහා නීති පැනවීමේ බලය බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුව සතුව තිබිණි.
- වාමාංශික සහ ජාතිකවාදී පක්ෂ තර්ක කළේ, බ්‍රිතාන්‍යයේ සාමි මන්ත්‍රී මණ්ඩලයට අනුව සකස් වී තිබුණ සෙනෙට් සභාව යටත් විජිත පාලන ක්‍රමයේ උරුමයක් බවයි. එක්සත් ජාතික පක්ෂ ආණ්ඩු යටතේ සෙනෙට් සභාවේ ආධිපත්‍යය තිබුණේ පාලක එක්සත් ජාතික පක්ෂයට සම්බන්ධ ප්‍රභූ සහ ගතානුගතික සමාජ ස්තර වලටය.
- 1970 මැතිවරණයෙන් බලයට පත් වූ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ලංකා කොමියුනිස්ට් පක්ෂය හා ලංකා සමසමාජ පක්ෂය අතර සන්ධාන ආණ්ඩුවට මුහුණදීමට සිදු වූ යථාර්ථයක් වූයේ ව්‍යවස්ථාදායකයේම එක් ආයතනයක් වූ සෙනෙට් සභාවේ බහුතරයක් තිබුණේ විපක්ෂයේ එක්සත් ජාතික පක්ෂයට බවයි. සෝල්බරි ව්‍යවස්ථාව ඉක්මනින් අහෝසි හෝ සංශෝධනය කිරීමට මෙය ද ආසන්න හේතුවක් විය.
- මේ අතර 1950 මැද භාගයෙන් පසු සෝල්බරි ව්‍යවස්ථාව සංශෝධනය කිරීමට උත්සාහ දෙකක් ගෙන තිබිණි. 1957 දී මහජන එක්සත් පෙරමුණ ආණ්ඩුව විසින් ඒ සඳහා පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවක් පත් කරන ලද අතර, එයින් යෝජනා කර තිබුණේ (අ) ලංකාව ජනරජයක් බවට පත් කිරීම සහ (ආ) මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයක් ව්‍යවස්ථාවට එකතු කරන ලෙස ය. මෙම වෙනස්කම් ඇති කිරීමට දේශපාලන පක්ෂ අතර එකඟතාවයක් ගොඩ නැගී තිබුණ ද 1959 සැප්තැම්බර් මස දී සිදු වූ අග්‍රාමාත්‍ය එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරනායක මහතාගේ අභාවය නිසා එම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ ප්‍රයත්නය තවදුරටත් ක්‍රියාත්මක වූයේ නැත.
- දෙවැනි උත්සාහය ගන්නා ලද්දේ 1965 දී බලයට පත් වූ එ.ජා.ප ආණ්ඩුව විසිනි. ලංකා ජනරජයක් විය යුතුදැයි සාකච්ඡා කිරීමට පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවක් ද පත් කෙරිණි. ශ්‍රී.ල.නි.ප.ය සහ වාමාංශික පක්ෂ ඉදිරිපත් කළ නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්පාදනය කළ යුතුයි යන යෝජනාවට ආණ්ඩු පක්ෂය එකඟ නොවූ නිසා එම උත්සාහය ඉදිරියට නොගියේය.
- 1970 දී ශ්‍රී.ල.නි.ප.ය සහ වාමාංශික පක්ෂ දෙක එකතුව ගොඩ නැගූ සමගි පෙරමුණ සන්ධානයේ මැතිවරණ ජයග්‍රහණය නිසා මූලික ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය වෙනසක් සඳහා වාසිදායක නව දේශපාල වාතාවරණයක් නිර්මාණය විය. 1970 පාර්ලිමේන්තු මැතිවරණයේදී සෝල්බරි ව්‍යවස්ථාව අහෝසි කර නව ජනරජ ව්‍යවස්ථාවක් සම්මත කිරීමට අවශ්‍ය ජනවරමක් ද, සමගි පෙරමුණ විසින් ලබා ගන්නා ලදි.

**නිගමනය (ලකුණු 02)**

- වාමාංශික සහ සිංහල ජාතිකවාදී බලවේග විසින් නිරන්තරයෙන් සිදු කරන ලද උද්ඝෝෂණ 1972 දී සෝල්බරි ව්‍යවස්ථාව අහෝසි කිරීමට තුඩු දුන්නේය. එහෙත් සුළු ජාතික දේශපාලන පක්ෂ මම නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සහාය පළ කළේ නැත. එයට ප්‍රධාන හේතුව වූයේ නව ව්‍යවස්ථාව විසින් සුළු ජාතීන්ගේ අයිතිවාසිකම් පිළිබඳ ප්‍රශ්නය නොසලකා හැරීමයි. සෝල්බරි ව්‍යවස්ථාව යටතේ තිබුණු සුළු ජන අයිතීන් ආරක්ෂා කිරීමේ විධිවිධාන ...

ජනරජ ව්‍යවස්ථාව විසින් අහෝසි කරනු ලැබීම සුළු ජන පක්ෂවල දැඩි විවේචනයට ලක් වූ කරුණකි.

**6. සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සාපේක්ෂව ශ්‍රී ලංකාවේ 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව විසින් පාර්ලිමේන්තුව සම්බන්ධව සිදුකරන ලද ප්‍රධාන වෙනස්කම් මොනවා දැයි විස්තර කරන්න.**

(ලකුණු 20)

අභිමතාර්ථ (ලකුණු 02)

මෙම ප්‍රශ්නයෙහි අරමුණ වන්නේ (අ) ව්‍යවස්ථාදායක සම්බන්ධයෙන් සෝල්බරි ව්‍යවස්ථාව සහ පළමු ජනරජයේ ව්‍යවස්ථාව පිළිබඳව අපේක්ෂකයින් සතු සංසන්දනාත්මක අවබෝධයත් (ආ) ව්‍යවස්ථා දෙක පිළිබඳව තුලනාත්මක විග්‍රහයක් ඉදිරිපත් කිරීමට අපේකෂකයින් සතු නිපුණතාවත් ඇගයීමට ලක් කිරීමයි.

අන්තර්ගතයේ විෂය කරුණු

මෙම ව්‍යවස්ථා දෙක බිහිවූයේ එකිනෙකට වෙනස් ඓතිහාසික සහ දේශපාලන පසුබිම් තුළ එකිනෙකට වෙනස් අරමුණ සහිතවය. එක් එක් ව්‍යවස්ථාව විසින් නිර්මාණය කරන ලද ව්‍යවස්ථාදායකයෙහි ස්වභාවය තීරණය කරන ලද්දේ එම පසුබිම් තත්ත්වයන් විසිනි. සෝල්බරි ව්‍යවස්ථාව බිහිවූයේ දේශපාලන බලය යටත් විජිත පාලකයින් විසින් දේශීය පාලක පන්තියට පැවරීමේ ක්‍රියාවලියේ කොටසක් හැටියටය. නව දේශපාලන ක්‍රමයේත්, ආණ්ඩුක්‍රමයේත් ආයතනික සහ දේශපාලනික ස්වභාවය තීර්ණය කළ නෛතික ලේඛනය වූයේ සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවයි. ඊට වෙනස් ව පළමුවැනි ජනරජ ව්‍යවස්ථාවේ දේශපාලන අරමුණ වූයේ සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව විසින් ගොඩ නගන ලද දේශපාන ක්‍රමය අහෝසි කර නව දේශපාලන ක්‍රමයක් පිහිටුවීමයි. යටත් විජිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවාදී උරුමයෙන් කැඩී යටත් විජිතහරණ අරමුණු ඉටුකර ගැනීම ඒ වෙතින් අපේක්ෂා කෙරේණි.

- සෝල්බරි ව්‍යවස්ථාව යටතේ පාර්ලිමේන්තුව ආයතන තුනකින් සමන්විත විය. ඒවා නම් රජිණ (හෝ අග්‍රාණ්ඩුකාරයා), නියෝජිත මන්ත්‍රී මණ්ඩලය සහ සෙනේට් සභාවයි. 1972 ව්‍යවස්ථාවෙන් මෙම තත්වය වෙනස් කරන ලදි. ඒ අනුව ජාතික රාජ්‍ය සභාව, නීති සම්පාදන බලය හිමි එකම ආයතනය විය.
- 1972 ව්‍යවස්ථාවේ 5 වැනි වගන්තියට අනුව ජාතික රාජ්‍ය සභාව ජනරජයෙහි රාජ්‍ය බලය හිමි උත්තරීතර ආයතනය ද විය. 45 වැනි වගන්තියට අනුව ජාතික රාජ්‍ය සභාව සම්මත කළ නීතියක වලංගුතාව ප්‍රශ්න කිරීමේ බලය කිසිඳු අධිකරණයක් හෝ වෙනත් ආයතනයක් සතු නොවීය.
- ව්‍යවස්ථාදායක දෙකෙහි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය මූලාශ්‍ර වෙනස් ඒවා විය. සෝල්බරි ව්‍යවස්තාවේ මූලාශ්‍රය වූයේ වෙස්ට්මින්ස්ටර් මාදිලිය යි. පළමු ජනරජ ව්‍යවස්ථාව එම මාදිලියෙන් හරයාත්මකව වෙනස් විය. එයින් නිර්මාණය කරන ලද්දේ වෙස්ට්මින්ස්ටර් සහ සමූහාණ්ඩු මාදිලි මිශ්‍ර කරගත් දෙමුහුන් ක්‍රමය.
- ප්‍රථම ජනරජ ව්‍යවස්ථාවේ සමූහාණ්ඩවාදී / ජනරජවාදී ලක්‍ෂණ මෙසේය : රාජ්‍ය නායකයා ජනාධිපතිවරයා ය. ඔහු ශ්‍රී ලාංකික පුරවැසියෙකි. පාර්ලිමේන්තුවට ව්‍යවස්ථාදායක පරමාධිපත්‍යය තිබේ. පාර්ලිමේන්තුවේ ව්‍යවස්ථාදායක පරමාධිපත්‍යය, එය සතු මහජන පරමාධිපත්‍යයේම දිගුවකි.

මෙම ව්‍යවස්ථාදායක දෙකෙහි ස්වභාවය හා බලතල පහත සඳහන් පරිදි සංසන්දනය කළ හැකිය.

| | සෝල්බරි ව්‍යවස්ථාව යටතේ | ප්‍රථම ජනරජ ව්‍යවස්ථාව යටතේ |
|---|---|---|
| ආයතනික සංයුතිය | ඒක මණ්ඩල | ද්වි මණ්ඩල |
| ව්‍යවස්ථාදායක බලය | ව්‍යවස්ථාදායක බලයට සීමා | පූර්ණ ව්‍යවස්ථාදායක බලය |
| මන්ත්‍රීවරුන් පත් කිරීම | සෘජුව තෝරා පත් කළ සහ වක්‍රව තෝරා පත් කළ මන්ත්‍රීන් | සෘජුව තෝරා පත් වූ මන්ත්‍රීන් පමණි |

- සෝල්බරි ව්‍යවස්ථාව යටතේ ව්‍යවස්ථාදායකය ද්වි මාණ්ඩලික වූයේ බ්‍රිතාන්‍ය සම්ප්‍රදායට අනුවය. ඒ අනුව ව්‍යවස්ථාදායකයේ එක් මණ්ඩලයක් සාමාන්‍ය මහ ජනතාවගේ නියෝජිතයන්ගෙන් සමන්විත විය යුතු වූ අතර අනෙක් මණ්ඩලයෙන් නියෝජනය කළේ සාම්ප්‍රදායික වශයෙන් ධනවත්, ඉඩකඩම් හිමි සහ වංශාධිපති සමාජ ස්ථරයි. ජනරජ ව්‍යවස්ථාව යටතේ වූ ව්‍යවස්ථාදායකය මෙම සම්ප්‍රදාය ප්‍රතික්ෂේප කර තිබිණි.
- පළමු වැනි ජනරජ ව්‍යවස්ථාවේ ආකෘතියට අනුව ව්‍යවස්ථාදායකය වන ජාතික රාජ්‍ය සභාව මහජන පරමාධිපත්‍යයේ ප්‍රධානතම ආයතනික ප්‍රකාශනය වන අතරම රාජ්‍ය බලයේ උත්තරීතර ආයතනය ද වේ. සෝල්බරි ව්‍යවස්ථාව යටතේ ව්‍යවස්ථාදායකය මෙම මූල ධර්මය නියෝජනය කළේ නැත. සෝල්බරි ව්‍යවස්ථාවට අනුව පරමාධිපත්‍යධරයා වූයේ ලංකාවේ මහජනතාව නොව බ්‍රිතාන්‍ය රජු / රැජිණයි. පළමු ජනරජ ව්‍යවස්ථාවේ මෙම වෙනසට පදනම වූයේ එහි ජනරජවාදී / සමූහාණ්ඩුවාදී මූල ධර්මය යි.

**නිගමනය (ලකුණු 02යි)**

සෝල්බරි සහ ප්‍රථම ජනරජ ව්‍යවස්ථා යටතේ පිහිටුවන ලද ව්‍යවස්ථාදායක දෙක අතර ඉහත සඳහන් කළ වෙනස්කම් වලට පදනම් වූයේ ව්‍යවස්ථාදායකය සම්බන්ධව ඒ දෙකෙහි ගැබ් වී තිබුණු එකිනෙකට වෙනස් දේශපාලන සම්ප්‍රදායයි. පළමු වැන්න වෙස්ට්මින්ස්ටර් පාර්ලිමේන්තු සම්ප්‍රදාය යි. දෙවැන්න සමූහාණ්ඩු / ජනරජවාදය යි. මෙම වෙනස ව්‍යවස්ථාදායකයෙහි (අ) ව්‍යවස්ථාදායක බලය (ආ) සංයුතිය (ඇ) සාමාජිකත්වය, සහ (ඈ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය සම්ප්‍රදාය සහ මූලාශ්‍රය යන කරුණු වලට බල පෑවේ ය.

**7. (i) ශ්‍රී ලංකාවේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනයෙහි අරමුණු වූයේ මොනවා ද?**
**(ii) ශ්‍රී ලංකාවේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 18 වන සහ 19 වන සංශෝධනවල අරමුණු සහ ප්‍රධාන ලක්ෂණ සංසන්දනය කරන්න.**

(i) 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනයේ අරමුණු (ලකුණු 05)

- 13 වැනි සංශෝධනයේ ප්‍රධාන අරමුණ දේශපාලනික එකක් විය. එය ආන්ඩුව සහ දෙමළ ජාතිකවාදී සටන්කාමී කණ්ඩායම් අතර යුද්ධයක තත්වයට අවතීර්ණ වී තිබූ ශ්‍රී ලංකාවේ වාර්ගික ගැටුමට ව්‍යවස්ථාමය-දේශපාලන විසඳුමක් ලබා දීමට උත්සාහ කිරීමකි.
- 1978 දෙවන ජනරජ ව්‍යවස්ථාව ශ්‍රී ලංකා ජනරජය "ඒකීය රාජ්‍යයක්" බව ප්‍රකාශ කරයි. 1980 දශකය වන විට, බලය බෙදීම සඳහා වූ නොවිසඳුණු ඉල්ලීම් හේතු කොටගෙන දෙමළ ජාතිකවාදී ව්‍යාපාර සන්නද්ධ ගැටුමක් දක්වා ව්‍යාප්ත වූ අතර, පසුව එය රාජ්‍යය සහ දෙමළ සටන්කාමී කණ්ඩායම් අතර සිවිල් යුද්ධයක් දක්වා වර්ධනය විය.
- ඉන්දීය අනුග්‍රහය ලද තිම්පු සාකච්ඡා දෙමළ ජාතිකවාදී කණ්ඩායම්වල ඉල්ලීම්වලට විසඳුමක් ලෙස ප්‍රාදේශීය ස්වයං පාලනයක් මත පදනම් වූ විසඳුමක් ඉස්මතුවීමට මග පෑදීය. ශ්‍රී ලංකාවේ ගැටුම තුළ මෙම ඉන්දීය මැදිහත්වීම, වාර්ගික ගැටුමට දේශපාලන විසඳුමක් සඳහා, ඉන්දීය සහ ශ්‍රී ලංකා රජයන් සහ දෙමළ ජාතිකවාදී කණ්ඩායම් අතර සාකච්ඡා සඳහා පහසුකම් සකස් කළේය. මෙම ක්‍රියාවලියෙහි කූටප්‍රාප්තිය වූයේ 1987 දී ආණ්ඩු දෙක අතර ඇති කරගත් ඉන්දු ලංකා ගිවිසුමයි. ශ්‍රී ලංකාවේ දෙවන ජනරජ ව්‍යවස්ථාවේ 13 වැනි සංශෝධනය යනු එම ගිවිසුමෙන් මතු වූ දේශපාලන යෝජනාවලියයි.
- 13 වැනි සංශෝධනයේ අරමුණු වූයේ ශ්‍රී ලංකාවේ දෙමළ සුළුතරයේ දෙවැදෑරුම් දුක්ගැනවිලි වලට ආමන්ත්‍රණය කිරීමයි. ඉන් පළමුවැන්න භාෂා සම අයිතිය තහවුරු කිරීමයි. ඒ අනුව දෙමළ භාෂාව රාජ්‍ය භාෂාවක් බවට පත් කරන ලදී. දෙවැන්න වූයේ පළාත්වලට බලය බෙදා හැරීමේ වැඩපිළිවෙළක් හඳුන්වා දීමයි. ඒ සඳහා නව පළාත් සභා ක්‍රමයක් හරහා පළාත් නවය අතර බලය බෙදීමේ වැඩපිළිවෙළක් හඳුන්වා දෙන ලදී.
- මේ අනුව සමස්තයක් ලෙස ගත් විට 13 වැනි සංශෝධනයේ පරමාර්ථ තුන් අකාරයක් ගනී: (අ) ශ්‍රී ලංකාවේ ජනවාර්ගික ගැටුම දේශපාලනිකව සහ සාකච්ඡා මාර්ගයෙන් විසඳීම, (ආ) බලය බෙදීම සහ පළාත් සභා හරහා ශ්‍රී ලාංකේය දෙමළ ප්‍රජාවට කලාපීය ස්වයං පාලන ක්‍රමයක් පිරිනැමීම සහ (ඇ) දේශපාලන උපායමාර්ග තුළින් ජනවාර්ගික යුද්ධය අවසන් කිරීම.

(ii) 18 වන සහ 19 සංශෝධනවල අරමුණු හා ප්‍රධාන ලක්ෂණ සංසන්දනය (ලකුණු 15)

**හැඳින්වීම (ලකුණු 02).**

- 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 18 වැනි සහ 19 වැනි සංශෝධන ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරයාගේ බලතල සහ අධිකාරිය සම්බන්ධයෙන් සිදු කළ වැදගත් වෙනස්කම් වන්නේය. මෙම සංශෝධන දෙකෙහි ජනාධිපතිවරයාගේ බලතල මෙන්ම සමස්තයක් ලෙස විධායක ජනාධිපති ක්‍රමය සම්බන්ධයෙන් එකිනෙකට පරස්පර ප්‍රවේශයන් දෙකක් ගැබ් වී තිබිණි. 18 වැනි සංශෝධනයෙන් ජනාධිපතිවරයාගේ බලතල වර්ධනය කිරීමට උත්සාහ ගැණුනු අතර, 19 වැනි සංශෝධනයේ අරමුණ වූයේ එම බලතල අඩු කර, 17 වැනි සංශෝධනය යටතේ පෙරදී තිබූ ආකාරයට, ප්‍රජාතන්ත්‍රවාදී රාමුවක් තුළ ජනාධිපති ධූරය සම්බන්ධයෙන් සංවරණ සහ තුලන යළිත් හඳුන්වා දීමයි.

**ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 18 සහ 19 සංශෝධනවල අරමුණු සංසන්දනය කිරීම. (ලකුණු 06)**

18 වැනි සංශෝධනය හඳුන්වාදීමේ ප්‍රකාශිත අරමුණ වූයේ "ආර්ථ

- එවකට පැවති රජය විසින් 18 වැනි සංශෝධනය හඳුන්වාදීමේ ප්‍රකාශිත අරමුණ වූයේ "ආර්ථික සංවර්ධනයට ප්‍රමුඛත්වය දීම"යි. මෙම ආර්ථික සංවර්ධන ඉලක්කවල නියම අරමුණ වූයේ සීමාවන් නොමැති, ශක්තිමත් විධායක ජනාධිපති සංවරණ සහ තුලන රහිත, බලතලවලට සීමාවන් නොමැති, ශක්තිමත් විධායක ජනාධිපති ක්‍රමයක් නිර්මාණය කිරීම සාධාරණීකරණය කිරීමකි. ප්‍රජාතන්ත්‍රවාදී සංවරණ සහ තුලන සැලකුණේ ජනාධිපතිවරයා දුර්වල කරන බාධක ලෙසයි . එනයින්, ආර්ථික සංවර්ධනය කඩිනම් කිරීම සඳහා වැඩි බලතල සහිත සහ වගවීමක් නොමැති, ශක්තිමත් ජනාධිපතිවරයකු අවශ්‍ය බව ඉස්මතු කරන ලදී.
- 18 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් සිදු වූ වෙනස්කම්වලට පරස්පරව, 19 වැනි සංශෝධනයෙන් අපේක්ෂා කළේ විධායක ජනාධිපති ක්‍රමයේ බලතල අඩු කිරීමයි. ඉන් විධායක ජනාධිපතිවරයාගේ බලතලවලට වන සංවරණ සහ තුලන ශක්තිමත් කිරීමට උත්සාහ කෙරිණි. විධායකය මත සංවරණ සහ තුලන ඇති කිරීමෙහිලා ව්‍යවස්ථාදායකයේ වැදගත් භූමිකාව ඉස්මතු කිරීම සහ රජයේ විධායක හා ව්‍යවස්ථාදායක ආයතන අතර බල තුලනය සහ බලතල වෙන්කිරීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීම සංශෝධනයේ ප්‍රධාන අරමුණු විය.
- විධායක ජනාධිපති ක්‍රමයේ බලතල ශක්තිමත් කිරීම 18 වැනි සංශෝධනයේ ප්‍රධාන දේශපාලන අරමුණ විය. ඒ අනුව, 18 වැනි ව්‍යවස්ථා සංශෝධනය මඟින් ජනාධිපතිවරයා උපරිම වශයෙන් තේරී පත් වීමේ වාර දෙකේ සීමාව ඉවත් කෙරුණු අතර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව සහ බලතල සහ කාර්යයන් අහෝසි කර ඒ වෙනුවට පාර්ලිමේන්තු සභාවක් පිහිටුවන ලදී. එවකට බලය හෙබවූ ජනාධිපතිවරයා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව සහ 17 වැනි ව්‍යවස්ථා සංශෝධනය යටතේ ස්ථාපිත කළ ස්වාධීන කොමිෂන් සභා ක්‍රමය දැක තිබුණේ, ජනපති වශයෙන් තම බලතලවලට සහ අධිකාරියට බාධාවක් ලෙසයෙනි. 18 වැනි සංශෝධනය යටතේ පිහිටුවන ලද පාර්ලිමේන්තු සභාව ජනාධිපතිවරයාගේ අභිමතානුසාරී බලතලවලට බාධා නොකරනු ඇතැයි අපේක්ෂා කෙරිණි.
- මීට පෙර, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 17 වැනි සංශෝධනය යටතේ පාලන ව්‍යුහයේ සහ රජයේ ආයතනවල වැදගත් හා ප්‍රධාන තනතුරු සඳහා සාමාජිකයන් පත් කිරීමට ජනාධිපතිවරයාට තිබූ බලය කප්පාදු කර තිබුණි. තවදුරටත් එමගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව සහ ස්වාධීන කොමිෂන් සභා ද පිහිටුවන ලදී. මෙලෙස ජනාධිපති බලතල සීමා කළ 17 වැනි සංශෝධනය අහෝසි කිරීම 18 වැනි සංශෝධනයේ මූලික අරමුණක් විය.
- 19 වැනි සංශෝධනය, 18 වැනි ව්‍යවස්ථා සංශෝධනය මගින් නිර්මිත "විධායක අධිකාරීවාදයෙන්" පැහැදිලි ලෙස වෙන් වූයේය.
- මේ අනුව, 19 වැනි සංශෝධනය පහත සඳහන් අරමුණු ඉලක්ක කළේය;
  - ❖ 18 වැනි සංශෝධනය අහෝසි කිරීම,
  - ❖ ජනාධිපතිවරයාගේ බලතල අඩු කිරීම,
  - ❖ පාර්ලිමේන්තුව ශක්තිමත් කිරීම
  - ❖ අග්‍රාමාත්‍ය ධූරය ශක්තිමත් කිරීම,
  - ❖ ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණ මූලධර්ම නැවත ...

❖ 17 වැනි සංශෝධනය යටතේ හඳුන්වා දී තිබූ ස්වාධීන කොමිෂන් සභා නැවත පණ ගැන්වීම.

**ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 18 වැනි සහ 19 වැනි සංශෝධනවල ප්‍රධාන ලක්ෂණ සංසන්දනය කිරීම.**

(ලකුණු 06)

**ජනාධිපතිවරයාගේ ධූර කාලය පිලිබඳ සීමා.**

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 31 (2) ව්‍යවස්ථාව අවලංගු කිරීමෙන් 18 වැනි සංශෝධනය මගින් පුද්ගලයකුට ජනාධිපති ධූරයට පත් විය හැකි වාර ගණන පිළිබඳ සීමාව ඉවත් කරන ලදී. 19 වැනි ව්‍යවස්ථා සංශෝධනය මගින් විධායක ජනාධිපති ක්‍රමයේ ධූරකාල සීමාවන් නැවත ගෙන එන ලදී. ඒ අනුව ජනාධිපතිවරයාගේ ධූර කාලය වසර 6 සිට 5 දක්වා අඩු කර ඇත. [19 වැනි සංශෝධනයේ 3 වැනි වගන්තිය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 30(2) වගන්තිය].
- 19 වැනි ව්‍යවස්ථා සංශෝධනය මගින් පුද්ගලයකුට ජනාධිපති ධූරය දැරිය හැකි උපරිම සීමාව වාර දෙකක් ලෙස යළි හඳුන්වා දෙන ලදී. මේ අනුව දෙවතාවක් ජනාධිපති ධූරයට පත්වන අයකු තෙවැනි වරට තරග කිරීමට නුසුදුස්සකු වේ. [19 වැනි සංශෝධනයේ 4 වැනි වගන්තිය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 31(2) වගන්තිය].

**විධායකය මත වන පාර්ලිමේන්තුවේ පාලනය.**

- 17 වැනි ව්‍යවස්ථා සංශෝධනය මගින් ඇති කරන ලද ජනාධිපතිවරයාගේ බලතල පිළිබඳ සංවරණ අවම කිරීම අරමුණු කොටගෙන, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව වෙනුවට පාර්ලිමේන්තු සභාවක් ඇති කරමින් 18 වැනි සංශෝධනය තීරණාත්මක වෙනස්කම් සිදු කළේය.
- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41 (අ) සිට 41 (ඌ) දක්වා වගන්ති ප්‍රකාර පාර්ලිමේන්තු පාලනය වෙනුවට 18 වැනි ව්‍යවස්ථා සංශෝධනය මගින් පාර්ලිමේන්තු සභාවක් ඇති කළේය.
  - ❖ සභාවේ සංයුතිය- 1. අගමැති 2. කථානායක 3. විපක්ෂ නායක 4. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ද වන, අග්‍රාමාත්‍යවරයා නම් කරන ලද අයෙක් 5. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ද වන විපක්ෂ නායකවරයා නම් කරන ලද අයෙක්.
  - ❖ කොමිෂන් සභාවල සභාපති සහ සාමාජිකයන් පත් කිරීමට නියමිතව තිබුණේ ජනාධිපතිවරයා විසිනි.
- 19 වැනි සංශෝධනය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව යළි හඳුන්වා දෙන ලදී - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් 7 දෙනෙකුගෙන් සහ කීර්තිධර පුද්ගලයන් 3 දෙනෙකුගෙන් සමන්විත විය. ජනාධිපතිවරයා විසින් පහත සඳහන් කොමිෂන් සභා සඳහා සාමාජිකයින් පත් කළ හැක්කේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත පමණි.

❖ මැතිවරණ කොමිෂන් සභාව
❖ රාජ්‍ය සේවා කොමිෂන් සභාව
❖ ජාතික පොලිස් කොමිසම
❖ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
❖ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව
❖ මුදල් කොමිෂන් සභාව
❖ සීමා නිර්ණය කොමිෂන් සභාව
❖ ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව
❖ විගණන සේවා කොමිෂන් සභාව.

## ජනාධිපති වරයාගේ බලතල සහ කැබිනට් මණ්ඩලයේ බලතල

- 18 වැනි ව්‍යවස්ථා සංශෝධනය මගින් පාර්ලිමේන්තු සභාවේ නිරීක්ෂණ කිසිවක් නොසලකා රජයේ ප්‍රධාන පත්වීම් කිරීමට ජනාධිපතිවරයාට බලය ලබා දී තිබිණි. 41 අ (6) වගන්තියට අනුව ජනාධිපතිවරයා පාර්ලිමේන්තු සභාවේ නිරීක්ෂණ ඉල්ලා සිටින විට සතියක් ඇතුළත අදාළ නිරීක්ෂණ දැනුම් දිය යුතුය. සභාව සිය නිරීක්ෂණ සතියක් ඇතුළත සන්නිවේදනය කිරීමට අපොහොසත් වුවහොත්, සිය අභිමතය මත පත්කිරීම සිදුකිරීමට ජනාධිපතිවරයාට බලය තිබුණි.

- රාජ්‍ය සේවා කොමිෂන් සභා පත්කිරීම් ජනාධිපතිවරයාගේ අභිමතය පරිදි පමණක් සිදු කිරීමේ අවකාශය ද නිර්මාණය කෙරිණ. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජිකයින් පත් කිරීමට නියමිතව තිබුණේ ජනාධිපතිවරයා විසින් වන අතර, ජනාධිපතිවරයා විසින් ම එක් එහි සාමාජිකයෙකු සභාපතිවරයා ලෙස පත් කරනු ලැබීය.

- කැබිනට් මණ්ඩලයට රාජ්‍ය සේවය සම්බන්ධයෙන් ඉහළ බලතල ලබාදීම - 55 වැනි ව්‍යවස්ථාව අවලංගු කිරීමෙන්, (අ) පත්වීම්, උසස්වීම්, ප්‍රතිපත්තිමය කරුණු මත වන තනතුරු සඳහා පත් කිරීම ඇතුළුව, ස්ථාන මාරුවීම්, විනය පාලනය සහ සේවයෙන් පහ කිරීම සම්බන්ධ රාජ්‍ය නිලධාරීන්ට අදාළ සියලු ප්‍රතිපත්තිමය කරුණු අමාත්‍ය මණ්ඩලය විසින් විධානය කිරීම සහ තීරණය කළයුතු බවට සංශෝධන සපයන ලදි.(ආ) සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන් පත් කිරීම, උසස් කිරීම, මාරු කිරීම, විනය පාලනය සහ සේවයෙන් පහ කිරීම අමාත්‍ය මණ්ඩලයට පැවරීමට ඒ මගින් නියමිත විය. (ඇ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව, සෙසු රාජ්‍ය නිලධාරීන් පත් කිරීම, උසස් කිරීම, මාරු කිරීම, විනය පාලනය සහ සේවයෙන් පහ කිරීම රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත පැවරිය යුතු විය.

- 18 වැනි සංශෝධනයෙන් පොලිස් කොමිසමේ සහ මැතිවරණ කොමිසමේ බලතල ද සීමා කෙරිණි. එමගින් ජාතික පොලිස් කොමිසමේ බලය පොලිසියට එරෙහිව මහජනතාවගෙන් ලැබෙන පැමිණිලි විමර්ශනයට පමණක් සීමා කෙරිණි.

- 19 වැනි සංශෝධනයෙන් ජනාධිපතිවරයාගේ අභිමතය පරිදි පාර්ලිමේන්තුව විසුරුවා හැරීමේ බලය ඉවත් කර ඇත - ජනාධිපතිවරයාට පාර්ලිමේන්තුව විසුරුවා හැරිය හැක්කේ පාර්ලිමේන්තුව විසුරුවා හරින ලෙස ඉල්ලා පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක් යෝජනාවක් සම්මත කළහොත් හෝ පාර්ලිමේන්තුවේ පළමු රැස්වීමේ සිට වසර හතරහමාරක් අවසන් වූ පසුව පමණි. [19 වැනි සංශෝධනයේ 17 වැනි වගන්තිය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 70(1) වගන්තිය].

- එමගින් ජනාධිපතිවරයාගේ සහ කැබිනට් අමාත්‍ය මණ්ඩලයේ බලතල වෙත නැවෙන සංවරණ සහ තුලන ලෙස පහත සඳහන් විධිවිධාන හඳුන්වා දෙන ලදි.

    - **අග්‍රාමාත්‍යවරයා ඉවත් කිරීමට ජනාධිපතිවරයාට ඇති බලය සීමා කිරීම** - ජනාධිපතිවරයාට සිය අභිමතය පරිදි අගමැති ඉවත් කිරීමට තවදුරටත් බලයක් නොමැත [19 වැනි සංශෝධනයේ 9 වැනි වගන්තිය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 46(2) වගන්තිය].

    - **කැබිනට් අමාත්‍යවරුන් ඉවත් කිරීම සම්බන්ධ සීමා පැනවීම** - ඕනෑම කැබිනට් අමාත්‍යවරයෙකු, කැබිනට් නොවන අමාත්‍යවරයෙකු හෝ නියෝජ්‍ය අමාත්‍යවරයෙකු පත් කිරීමේදී හෝ ධූරයෙන් ඉවත් කිරීමේදී ජනාධිපතිවරයා විසින් අග්‍රාමාත්‍යවරයාගේ උපදෙස් මත ක්‍රියා කළ යුතුය [19 වැනි සංශෝධනයේ 9 වැනි වගන්තිය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 43(2), 44(1), 45(1) සහ 46(3)(අ) වගන්ති].

- **පාර්ලිමේන්තුව විසුරුවා හැරීමට ජනාධිපතිවරයාට හැකියාව ලැබෙන කාල සීමාව වසර 1 සිට වසර 4 හමාරක් දක්වා දීර්ඝ කිරීම.**
- **පාර්ලිමේන්තුවේ වාර කාලය** වසර 6 සිට 5 දක්වා අඩු කරන ලදි [19 වන සංශෝධනයේ 15 වන වගන්තිය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 62(2) වගන්තිය].
- **නීති ප්‍රකාරව තොරතුරු වෙත ප්‍රවේශ වීමේ අයිතිය ඇතුළත්** කිරීම - (මේ හා අනුබද්ධව තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනත නිර්මාණය කෙරිණි). (19 වැනි සංශෝධනයේ 2 වැනි වගන්තිය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14A වගන්තිය).
- **ද්විත්ව පුරවැසිභාවයට අදාළ විධි විධාන** - සංශෝධනයට අනුව ද්විත්ව පුරවැසියන් වන පුද්ගලයින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් ලෙස තේරී පත්වීමට නුසුදුස්සකු වේ.

**නිගමනය (ලකුණු 2)**

18 වන සහ 19 වන සංශෝධන 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ හඳුන්වා දුන් ශ්‍රී ලංකාවේ ජනාධිපති ක්‍රමයේ පරිනාමයේ අවධි දෙකක් නියෝජනය කරයි. මීට පෙර, විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කළ යුතු බවට ප්‍රබල තර්කයක් මතු විය. එහෙත්, 18 වැනි සංශෝධනය එම ප්‍රවේශයට පටහැනිව ගොස් ජනාධිපතිවරයාගේ අධිකාරිය සහ බලතල යළි වැඩි දියුණු කළේය. කෙටි කලකින්, නැවතත් ජනාධිපතිවරයාගේ බලතල අඩු කිරීමේ තර්කය පණ ගැන්වුණු අතර එහි ප්‍රතිඵලය වූයේ 19 වැනි සංශෝධනයයි. කෙසේ වෙතත්, 19 වන සංශෝධනය කෙටිකාලීන වූ අතර 18 වන සංශෝධනයේ රාමුව නැවත ගෙන ඒම සඳහා 2021 දී එය අවලංගු කරන ලදි. මින් පෙනී යන්නේ විධායක ජනාධිපති ක්‍රමය ශ්‍රී ලංකාවේ දේශපාලනයේ නොවිසඳුණු ගැටලුවක් ලෙස අඛණ්ඩව පවතින බවයි.

**(උපරිම ලකුණු 15)**

## III කොටස

8. (i) ඇමෙරිකා එක්සත් ජනපදයේ සංඩීය ආණ්ඩුක්‍රමය තුළ මධ්‍යම ආණ්ඩුව සතු බලතල කෙටියෙන් විස්තර කරන්න.
   (ii) බ්‍රිතාන්‍යයේ ඒකීය ආණ්ඩුක්‍රම මාදිලිය මෑත වසරවලදී වෙනස් වී ඇති ආකාරය පෙන්වා දෙන්න.

**(i) ඇමරිකා එක්සත් ජනපදයේ සංඩීය ආණ්ඩුක්‍රමය තුළ මධ්‍යම ආණ්ඩුව සතු බලතල** **(ලකුණු 10)**

**අරමුණු**

මෙම ප්‍රශ්නයෙන් මධ්‍යම ආණ්ඩුවේ බලතල කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින්, ඇමෙරිකා එක්සත් ජනපදයේ සංඩීය ක්‍රමය පිලිබඳව අපේක්ෂකයින් සතු දැනුම තක්සේරු කිරීම අපේක්ෂිතයි.

**අන්තර්ගතය: ප්‍රධාන විෂය කරුණු**

- ඇමෙරිකා එකසත් ජනපදය සතුව සංඩීය මාදිලියේ ආණ්ඩුවක් ඇත. ඒ නිසා ව්‍යවස්ථාදායක, විධායක සහ අධිකරණ බලතල මධ්‍යම ආණ්ඩුව සහ ප්‍රාන්ත ආණ්ඩු අතර බෙදා හැර ඇත. එසේ බලය බෙදා හැර තිබුණද, ශක්තිමත් මධ්‍යයක් සහ සන්ධීය ආකෘතිය තුළ ශක්තිමත් එක්සත් ජනපදයක් නිර්මාණය කරනු පිණිස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් මධ්‍යම ආණ්ඩුව වෙත පුළුල් බලතල පවරා තිබේ.
- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 8 වන කොටසෙහි 1 වන වගන්තිය මධ්‍යම රජය වෙත වන බලතල විස්තර කරයි. මෙම බලතල "අවධාරිත බලතල" ලෙස හඳුන්වා දී තිබේ. පොදුවේ, මධ්‍යම ආණ්ඩුව සතුවන බලතල ෆෙඩරල් නීතියේ උත්තරීතරත්වය සම්බන්ධ බලය, යුද්ධය, ආරක්ෂාව, ආරක්ෂාව සම්බන්ධ

වගකීම්, අන්තර්ජාතික සම්බන්ධතා, ජාත්‍යන්තර වෙළෙඳාම, බදුකරණය හා වියදම් යන ක්ෂේත්‍ර අළලා පවතී.

- ඒ අනුව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පහත සඳහන් ව්‍යවස්ථාදායක, විධායක සහ අධිකරණ බලතල මධ්‍යම ආණ්ඩුවේ බලතල ලෙස විශේෂයෙන් අවධාරණය කරයි.

i. බදු එකතු කිරීම, තීරු බදු, අයකිරීම් සහ සුරාබදු අය කිරීම සහ එකතු කිරීම, ණය ගෙවීම, එක්සත් ජනපදය වෙනුවෙන් මුදල් ණයට ගැනීම සහ එක්සත් ජනපදයේ පොදු ආරක්ෂාව සහ පොදු සුභසාධනය සැපයීම.

ii. විදේශ සමඟ, ප්‍රාන්ත අතර සහ මුල් වාසී ගෝත්‍රිකයන් සමග වාණිජ කටයුතු නියාමනය කිරීම.

iii. කාසි මුද්‍රණය කිරීම, මුදල්වල වටිනාකම නියාමනය කිරීම සහ කිරුම් මිනුම්වල ප්‍රමිතිය සකස් කිරීම.

iv. එක්සත් ජනපදයේ සුරකුම්පත් සහ මුදල් ව්‍යාජ ලෙස සකස් කිරීම යන ක්‍රියා සඳහා දඬුවම් පැනවීම.

v. තැපැල් කාර්යාල පිහිටුවීම.

vi. නිර්මාණ කරුවන් සහ නව නිපැයුම්කරුවන්ගේ ලේඛන සහ සොයාගැනීම් සඳහා අයිතිය සුරක්ෂිත කිරීම ඇසුරින් විද්‍යාවේ සහ ඵලදායී කලාවන් හී ප්‍රගතිය ප්‍රවර්ධනය කිරීම.

vii. ශ්‍රේෂ්ඨාධිකරණයට පහලින් ස්ථාපිත කර ඇති විනිශ්චය මණ්ඩල පිහිටුවීම.

viii. ජාත්‍යන්තර නීතිවලට එරෙහිව මහ මුහුදේ සිදු කරන මුහුදු කොල්ලකෑම්, අපරාධ සහ වැරදි නිර්වචනය කර දඬුවම් කිරීම.

ix. යුද්ධය ප්‍රකාශ කිරීම සහ ගොඩබිම සහ ජලය ආක්‍රමණය කිරීම සම්බන්ධයෙන් නීති පැනවීම.

x. හමුදා නඩත්තු කිරීම සහ ඒවායේ සහායක ක්‍රියාවලි සිදු කිරීම.

xi. නාවික හමුදාවක් පවත්වාගෙන යාම.

xii. එක්සත් ජනපදයේ නීති ක්‍රියාත්මක කිරීමට, කැරලි මර්දනය කිරීමට සහ විදේශ ආක්‍රමණ මැඩලීම සඳහා බලඇණි පිහිටුවීම.

- මේ අනුව, එක්සත් ජනපදයට ප්‍රාන්ත ආණ්ඩු සඳහා ස්වයං පාලනයක් සහිත සංඝීය ව්‍යවස්ථාවක් ඇතත් ව්‍යවස්ථාව මගින් එහි සංඝීය මූලධර්මවලට හානි නොවන සේ බලවත් මධ්‍යයම රජයක් ද නිර්මාණය කර ඇත.

8 (ii) බ්‍රිතාන්‍ය ඒකීය ආණ්ඩුක්‍රම මාදිලිය මෑත වසරවලදී වෙනස්වී ඇති ආකාරය (ලකුණු 10)

අරමුණ

මෙම ප්‍රශ්නයේ අරමුණ වන්නේ බ්‍රිතාන්‍ය ආණ්ඩුක්‍රමයේ ඒකීය ස්වභාවය මෑත කාලීනව විපරිවර්තනය වී ඇති ආකාරය පිළිබඳ අපේක්ෂකයාගේ අවබෝධය තක්සේරු කිරීමයි.

**අන්තර්ගතයඃ විෂය කරුණු**

- එංගලන්තය, ස්කොට්ලන්තය, වේල්සය සහ උතුරු අයර්ලන්තය යන ජාතික ඒකක හතරකින් සමන්විත වුව ද, එක්සත් රාජධානිය සතුව ඒකීය සහ මධ්‍යගත ආණ්ඩුක්‍රම මාදිලියක් තිබිණි. එම ඒකක එංගලන්තයේ දේශපාලන හා හමුදා ආධිපත්‍යයේ ප්‍රතිඵලයක් ලෙස එක්සත් රාජධානිය බවට පත් වී තිබේ.
- එක්සත් රාජධානිය මධ්‍යගත රාජ්‍යයක් වුවද, එය දේශපාලනිකව එක්සත් රාජ්‍යයක් නොවීය. ස්කොට්ලන්තය, වේල්සය සහ උතුරු අයර්ලන්තයේ නිදහස සඳහා ජාතිකවාදී ව්‍යාපාර වර්ධනය වී තිබේ. කලාපීය ජාතිකවාදයේ නැගීම නිසා බ්‍රිතාන්‍යයේ දේශපාලන ක්‍රමය ඒකීය මාදිලියේ සිට

අර්ධ සංඝීය මාදිලියක් දක්වා පරිවර්තනය කිරීම සිදු වී ඇත. එය ස්කොට්ලන්තයට, වේල්සයට සහ උතුරු අයර්ලන්තයට විවිධ මට්ටමේ ප්‍රාදේශීය ස්වයං පාලනය භුක්ති විඳීමට ඉඩ සලසයි. බ්‍රිතාන්‍ය දේශපාලන ක්‍රමයේ මෙම ප්‍රධාන වෙනස සිදු වූයේ 1998 දී ය.

- ස්කොට්ලන්තය, වේල්සය සහ උතුරු අයර්ලන්තය වෙත බලය බෙදීම නිසා එක්සත් රාජධානියේ ඒකීය භාවයට හෝ වෙස්ට්මින්ස්ටර් පාර්ලිමේන්තුවේ ස්වෛරීභාවයට හානියක් සිදු වී නැත. කෙසේ වෙතත්, මෙසේ වර්ධනය වන දේශපාලන යථාර්ථයන් නිසා එක්සත් රාජධානියේ අර්ධ සංඝීය ආණ්ඩුක්‍රම මාදිලියක් වර්ධනය වන බවට ලකුණු පහළ වෙමින් තිබේ.
- මේ අනුව, අද්‍යතන බ්‍රිතාන්‍යය අසමමිතිකව බලය විමධ්‍යගත කර ඇති දේශපාලන ක්‍රමයක් වන අතර, එය එංගලන්තය සහ බලය බෙදා හැරුණු ආණ්ඩු සහිත ප්‍රාන්ත තුනකින් සමන්විත වේ: එනම්, ස්කොට්ලන්තය, වේල්සය සහ උතුරු අයර්ලන්තයයි. එක්සත් රාජධානියේ පාර්ලිමේන්තුව විසින් ස්වාධිපත්‍යය රඳවා ගනු ලැබුවද, 1998 බලය බෙදීමෙන් පසු ස්කොට්ලන්ත පාර්ලිමේන්තුව සහ වේල්සයේ මෙන්ම උතුරු අයර්ලන්තයේ පාර්ලිමේන්තු වෙනස් මට්ටම්වල ව්‍යවස්ථාදායක බලතල අත්කරගෙන ඇත.
- බ්‍රිතාන්‍යයේ දැනට පවත්නා බලය බෙදීමේ විධිවිධාන මගින් ස්ථාපිත බල මට්ටම් සමමිතික හෝ සමාන නොවේ. එබැවින්, බෙදාහැර ඇති ව්‍යවස්ථාදායක ආයතන තුනෙහි බලතල, ස්වභාවය සහ විෂය පථය එකිනෙකින් වෙනස් වේ. වේල්ස් සහ උතුරු අයර්ලන්ත ව්‍යවස්ථාදායක සභාවල බලතලවලට වඩා ස්කොට්ලන්ත පාර්ලිමේන්තුවට වැඩි බලතල ඇත. ඒකක අතර බෙදා හරින ලද බලයේ මෙම අසමාන ව්‍යාප්තිය "අසමමිතික බලය බෙදීම"ලෙස හැඳින්වේ.
- මේ අනුව, අතීතයේ ඒකීය සහ මධ්‍යගත රාජ්‍යයක් වූ එක්සත් රාජධානිය දැන් බහු-ජාතික සමාජයක් ලෙස හඳුනාගෙන ඇත. එබැවින් බ්‍රිත්‍යතාන්‍ය පාර්ලිමේන්තුව සාම්ප්‍රදායික ඒකීය ව්‍යවස්ථාමය ආකෘතියෙන් බැහැර වූ බලය බෙදා හැරීමේ දේශපාලන ක්‍රමයක් ස්ථාපිත කර ඇත. එය (අ) බ්‍රිතාන්‍ය සමාජයේ ජනවාර්ගික හා සංස්කෘතික විවිධත්වය සහ (ආ) එම වාර්ගික විවිධත්වය පිළිබිඹු කිරීම සඳහා ඒකීය රාජ්‍යය ප්‍රතිසංස්කරණය කිරීමේ අවශ්‍යතාව ද පිළිගැනීමකි.

| | |
|---|---|
| 9. | (i) රාජ්‍ය ප්‍රතිපත්ති හැදෑරීම වැදගත් වන්නේ මන් ද?<br>(ii) රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාවලියේදී (අ) ව්‍යවස්ථාදායකයේ, සහ (ආ) සිවිල් සමාජයේ භූමිකාව පැහැදිලි කරන්න. |

9 (i) රාජ්‍ය ප්‍රතිපත්ති හැදෑරීමේ වැදගත්කම (ලකුණු 05)

**අරමුණ:** නූතන රාජ්‍යයන් සහ ප්‍රජාතන්ත්‍රවාදී රටවල රාජ්‍ය ප්‍රතිපත්ති අධ්‍යයනය වැදගත් වන්නේ මන්දැයි අපේක්ෂකයාගේ අවබෝධය ඇගයීමයි.

රාජ්‍ය ප්‍රතිපත්ති අධ්‍යයනය කිරීමෙන් අපට පොදු ප්‍රතිපත්ති මගින් විසඳීමට උත්සාහ කරන පොදු සමාජ ගැටලු මොනවාද, එවැනි ප්‍රතිපත්ති සකස් කර ක්‍රියාත්මක කරන්නේ කෙසේද, ඒවායේ ප්‍රතිඵල සහ අඩුපාඩු සහ වඩා හොඳ රාජ්‍ය ප්‍රතිපත්ති සකස් කර වඩාත් ඵලදායි ලෙස ක්‍රියාත්මක කළ හැක්කේ කෙසේද යන්න තේරුම් ගැනීමට හැකියාව ලැබේ.

රාජ්‍ය ප්‍රතිපත්ති අධ්‍යයනයේ වැදගත්කම පර්යාලෝකන, නැතහොත් දෘෂ්ටිකෝණ, තුනක් ඇසුරින් සාධාරණීකරණය කළ හැකිය.

**විද්‍යාත්මක පර්යාලෝකනය:** රාජ්‍ය ප්‍රතිපත්ති අධ්‍යයනය කිරීමෙන් රාජ්‍ය ප්‍රතිපත්ති කෙරෙහි බලපාන සාධක මෙන්ම ඒවායෙහි බලපෑම ද හඳුනාගත හැකිය. එමගින් වඩාත් සාධනීය ආණ්ඩුකරණයක් සඳහා අවශ්‍ය නිර්දේශ සැපයීමේ හැකියාව අපට ලැබේ. රාජ්‍ය ප්‍රතිපත්ති සඳහා බලපෑම් ලැබෙන්නේ සහ ඒවා ක්‍රියාවට නැංවෙනු ලැබෙන්නේ බහුවිධ ප්‍රජාවන් ජීවත් වන සමාජයක් තුළයි. රාජ්‍ය, සමාජය සහ වෙළඳපොල යන ප්‍රධාන ආර්ථික, දේශපාලන හා සමාජ ව්‍යුහයන් නිරන්තර අන්තර් සම්බන්ධතා දක්වන අතර අනිවාර්ය අන්‍යෝන්‍යය බලපෑම් ද සහිතව ක්‍රියාත්මක වේ. රාජ්‍ය ප්‍රතිපත්ති පිළිබඳ විද්‍යාත්මක අධ්‍යනයක් අපට එම සංකීර්ණ සම්බන්ධතා තේරුම් ගැනීමට උපකාරී වේ. ඉහත අන්තර්ක්‍රියා, බලපෑම් සහ අන්තර් රඳා පැවැත්මේ බහුවිධ ගැටලු විසඳීම සඳහා රාජ්‍ය ප්‍රතිපත්ති විද්‍යාත්මකව අධ්‍යයනය කිරීම අත්‍යවශ්‍ය වේ.

**දේශපාලන පර්යාලෝකනය:** රාජ්‍ය ප්‍රතිපත්ති අධ්‍යයනය මහජන ගැටළු විසඳීමට ඇති විවිධ ආණ්ඩු මට්ටම් හඳුනා ගැනීමට සහ අවබෝධ කර ගැනීමට උපකාර වේ. බලය බෙදා හැරීමේ ස්වභාවය කුමක් වුවත්, නූතන රාජ්‍යය තුළ ප්‍රතිපත්ති ක්‍රියාවලියක් ක්‍රියාත්මක වේ. රාජ්‍ය ප්‍රතිපත්ති මනාව අධ්‍යයනය කිරීමට ආණ්ඩුවේ විවිධ තල මෙන්ම ප්‍රතිපත්ති ක්‍රියාවලියට සම්බන්ධ ක්‍රියාකාරීන්, ආයතන සහ පාත්‍රවර්ගයා පිළිබඳ මනා අවබෝධයක් ද අවශ්‍ය වේ.

**ප්‍රායෝගික පර්යාලෝකනය:** ප්‍රතිපත්තිමය ගැටළු නිරාකරණය කිරීමට පුරවැසියන් ලෙස මැදිහත් වීමේ වගකීමක් මහජනතාවට තිබේ. පුරවැසියන් ලෙස ප්‍රතිපත්ති ක්‍රියදාමය ගැන අවබෝධයක් තිබිය යුතු ය. එසේ නැතහොත් දේශපාලන ක්‍රමයක් ගන්නා තීරණ වල සහ එම ප්‍රතිපත්තිවල හොඳ නරක සහ ප්‍රායෝගික ප්‍රතිඵල පිළිබඳ නිගමනයකට එළඹීමට මහජනතාවට නොහැකි ය.

9 (ii) රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාවලියේ දී (අ) ව්‍යවස්ථාදායකයේ සහ (ආ) සිවිල් සමාජයේ කාර්යයභාරය

(අ) රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාවලිය තුළ ව්‍යවස්ථාදායකයේ කාර්යභාරය. (ලකුණු 15)

අරමුණ: මෙම ප්‍රශ්නය රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාවලිය තුළ ව්‍යවස්ථාදායකය සහ සිවිල් සමාජය විසින් ඉටු කරනු ලබන කාර්යභාරය පැහැදිලි කිරීම අරබයා අපේක්ෂකයින්ගේ දැනුම තක්සේරු කිරීමට අදහස් කරයි.

හැඳින්වීම (ලකුණු 02)

- නූතන රාජ්‍යවල රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනයේ ප්‍රධාන ආයතනය ව්‍යවස්ථාදායකයයි. ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලියට සිවිල් සමාජයේ සහාය ද ලැබේ. මහජනතාව උදෙසා ප්‍රතිපත්ති සැකසීමේදී ව්‍යවස්ථාදායකය එය නියෝජනය කරන මහජන පරමාධිපත්‍යයෙහි ගැබ් වන අධිකාරිය භාවිතා කරන අතර සිවිල් සමාජය පුරවැසියන්ගේ විවිධ අභිලාෂ සහ අවශ්‍යතා ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලිය තුළට ගෙන ඒමට උත්සාහ කරයි. ව්‍යවස්ථාදායකය විසින් රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනයේ මෙවලම ලෙස නීති සම්පාදනය භාවිත කරන අතර, සිවිල් සමාජය ලොබි කිරීම, පුරවැසියන් මෙහෙයවීම සහ සංවිධානය කරන ලද මහජන පීඩනය රාජ්‍ය ප්‍රතිපත්තිවලට බලපෑම් කිරීමේ මාධ්‍යයන් ලෙස භාවිත කරයි.

* නූතන ප්‍රජාතන්ත්‍රවාදී රටවල ව්‍යවස්ථාදායකය යනු ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලිය හසුරුවන කේන්ද්‍රීය ආයතනයයි. ඒ හා සමානවම, ව්‍යවස්ථාදායක ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා අරමුදල් වෙන් කිරීමට, සමස්ත ප්‍රතිපත්ති ක්‍රියාවලිය අධීක්ෂණය කිරීමට සහ සමහර ප්‍රතිපත්ති අවසන් කිරීමට සම්බන්ධ වෙති. රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාවලිය තුළ ව්‍යවස්ථාදායකයේ සංකීර්ණ මැදිහත්වීම ව්‍යවස්ථාදායකයන් විසින් ක්‍රියාත්මක කරන පහත සඳහන් භූමිකාව ඇසුරින් අවබෝධ කර ගත හැකිය.

**අන්තර්ගතය: විෂය කරුණු**

**නීති සම්පාදනය:** මහජන ගැටළු විසඳීම සඳහා ලැබෙන පරමාධිපත්‍යය මගින් නිර්මාණය වන අධිකාරි බලය උපයෝගී කොට ගෙන ව්‍යවස්ථාදායකය නීති සම්පාදනය කරයි. ව්‍යවස්ථාදායකයේ අධිකාරි බලය රාජ්‍යයේ පරමාධිපත්‍ය බලයෙන් උත්පාදනය වී තිබේ.

**නියෝජනය:** ව්‍යවස්ථාදායකයන් සහ ඒවායේ සාමාජිකයෝ ප්‍රතිපත්ති සම්පාදනයේදී පුරවැසියන්ගේ අභිලාශ, අවශ්‍යතා සහ අපේක්ෂා නියෝජනය කරති. ව්‍යවස්ථාදායකයේ සාමාජිකයන් ද වන මහජන නියෝජිතයෙන් ප්‍රතිපත්ති නිර්මාණය කිරීමේදී  සඳහා පුරවැසියන් වෙනුවෙන් ආණ්ඩුව සමඟ ගනුදෙනු කරති.

**නීති ක්‍රියාත්මක කිරීම:** මහජන ගැටළු හඳුනා ගැනීම, එම ගැටළු අධ්‍යයනය කිරීම, විශේෂඥ සහ මහජන අදහස් ලබා ගැනීම, ප්‍රතිපත්ති සකස් කිරීම හෝ අනුමත කිරීම, සහ එම ප්‍රතිපත්ති ක්‍රායාත්මක කිරීම සඳහා සැලසුම් කර ඇති නීති මගින් එම ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම යන ක්‍රියාවලීන් ජනතා පරමාධිපත්‍යය ඇසුරින් සහ රාජ්‍ය ස්වාධිපත්‍යය තුළින් ලැබෙන අධිකාරිය උපයෝගී කරගනිමින් සිදු කරන්නේ ව්‍යවස්ථාදායකයයි.

අරමුදල් සම්පාදනය කිරීම: රාජ්‍ය ප්‍රතිපත්ති තුළින් මහජනතාවගේ ගැටලු විසඳීම සඳහා අරමුදල් අවශ්‍ය වේ. මහජන ඉල්ලීම්වලට ප්‍රතිචාර දැක්වීම සඳහා ප්‍රතිපත්තිමය මූලපිරීම් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය මහජන මුදල් වෙන් කිරීමට ව්‍යවස්ථාදායකයට බලය ඇත. නූතන ප්‍රජාතන්ත්‍රවාදී රටවල ව්‍යවස්ථාදායකය මහජන මුදල්වල භාරකරුවාය. රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති සහ අයවැය ක්‍රියාවලිය හරහා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා මුදල් වෙන් කිරීම ව්‍යවස්ථාදායකයේ වගකීමකි.

**අධීක්ෂණ කාර්යයන්:** ව්‍යවස්ථාදායකය රජයේ ක්‍රියාකාරකම්වල විනිවිදභාවය, වගවීම සහ පවතින නීති සහ රෙගුලාසිවලට අනුකූලව සිදුවන බව සහතික කිරීම සඳහා රජයේ ක්‍රියාකාරකම් නිරීක්ෂණය කිරීම, සමාලෝචනය කිරීම සහ විමර්ශනය කිරීම මගින් නීති ක්‍රියාත්මක කිරීම, ප්‍රතිපත්ති සහ වැඩසටහන් ද අධීක්ෂණය කරයි.

සමකාලීන ලෝකය තුළ, රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනයේදී ව්‍යවස්ථාදායකයේ භූමිකාව හීන වීමේ ප්‍රවණතාවක් ද වේ. මෙම නැඹුරුව සඳහා හේතු කිහිපයක් තිබේ. ඒවායින් සමහරක් නම්:

i. **දේශපාලන පක්ෂ ක්‍රමයේ ව්‍යාප්තිය:** පක්ෂ ක්‍රමය නිසා ඡන්දදායකයින් දේශපාලන පක්ෂවලට ඡන්දය දෙන්නේ නිශ්චිත ප්‍රතිපත්තිමය තෝරා ගැනීම් සහිතවය. එබැවින් ව්‍යවස්ථාදායකය සාමාන්‍යයෙන් තමන්ගේම කලින් තීරණය කරන ලද ප්‍රතිපත්ති ප්‍රමුඛතා ඇති බහුතර ආසන සංඛ්‍යාවක් සහිත දේශපාලන පක්ෂයේ බලපෑමට යටත් වේ.

ii. දිනෙන් දින වර්ධනය වන සමාජ ගැටලු සංකීර්ණ වීම නිසා රාජ්‍ය ප්‍රතිපත්ති සැකසීමට ව්‍යවස්ථාදායකයට ඇති හැකියාව ද අඩුවෙමින් පවතී. එම කාර්යභාරය ප්‍රතිපත්ති විශේෂඥයින් විසින් පවරා ගනු ලැබේ. මෙම පසුබිම තුළ විශේෂඥයින් සහ නිලධර තන්ත්‍රය විසින් සකස් කරන ලද ප්‍රතිපත්ති අනුමත කරන රබර් මුද්‍රාවක් බවට ව්‍යවස්ථාදායකය පත්ව ඇත.

iii. ව්‍යවස්ථාදායකයේ සාමාජිකයින් ලෙස ප්‍රතිපත්ති සම්පාදකයින්ට දැක්විය හැක්කේ ප්‍රතිපත්තිවල පුළුල් දිශානතීන් පමණි. සැබවින්ම ප්‍රතිපත්ති බවට පත්වන්නේ අවසානයේ ක්‍රියාත්මක වන දෙයයි.

iv. බොහෝ රටවල, සාමාන්‍යයෙන් ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීමට සම්බන්ධ වන විධායකය, රාජ්‍ය ප්‍රතිපත්තියේ ස්වභාවය තීරණය කිරීමේදී වැඩි අවකාශයක් අත් කරගෙන ඇති අතර, එමගින් ද ව්‍යවස්ථාදායකයේ කාර්යභාරය සීමා වී තිබේ.

**(ආ) රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාවලියේදී සිවිල් සමාජයේ භූමිකාව.**

සිවිල් සංවිධාන ලෙසද හැඳින්වෙන සිවිල් සමාජ සංවිධාන, පුරවැසියන් එකිනෙකා හමු වී , පොදු ගැටලු සාකච්ඡා කර, ඒවාට විසඳුම් සෙවීමේ පරිමණ්ඩලයකින් සමන්විත වේ. මෙම පරිමණ්ඩලයේ ක්‍රියාකාරී පුරවැසි සංවිධාන සිවිල් සංවිධාන ලෙස හැඳින්වේ. මෙම සිවිල් සංවිධාන රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාවලියේ වැදගත් කතෘකයෙකි. ඔවුහු ප්‍රතිපත්ති චක්‍රයේ සෑම අදියරකටම සහභාගී වෙති.

මෑත කාලයේදී, දේශපාලනය තුළ සිවිල් සහභාගිත්වයේ නව රටා, සාමූහික සංවිධානය වීම් සහ සමාජීය මෙහෙයුම් පුළුල් ලෙස පැතිරී ඇත. ලොව පුරා, සිවිල් ක්‍රියාකාරිත්වයේ නව ආකාර බොහොමයක් ද මතු වී ඇත. ඒවා වඩාත් සහභාගිත්වවාදී, අවිධිමත්, ගැටළු-පාදක සහ පුළුල් ලෙස ජාලගත වීම් සහිත වේ. මහජන සංවිධාන තුළ හුදෙක් නිෂ්ක්‍රිය නිරීක්ෂකයන් වශයෙන් පමණක් සිටීමට පුරවැසියන්ට තවදුරටත් අවශ්‍ය නැත. ඒ වෙනුවට, ඔවුන්ට අවශ්‍ය වන්නේ ප්‍රතිපත්ති සහ ප්‍රතිපත්ති ප්‍රතිඵල සැකසීමට සහ තීරණ ගැනීමේ ක්‍රියාවලීන්හි වඩාත් ක්‍රියාකාරී සහ සහභාගිත්ව භූමිකාවන් ඉටු කිරීමට ය. රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාවලිය තුළ සිවිල් සමාජයේ කාර්යභාරය විවිධ ආකාරවලින් නිරීක්ෂණය කළ හැකිය.

රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනයේදී සිවිල් සමාජයේ ප්‍රධාන කාර්යයන් මෙලෙස දැක්විය හැක.

- දේශපාලන සහ ප්‍රතිපත්ති න්‍යායපත්‍රවල අවධානයට ජනතා ගැටලු ගෙන ඒම - සිවිල් සමාජය සහ සිවිල් සමාජ සංවිධාන ඉල්ලීම්, විරෝධතා දැක්වීම සහ බලපෑම් කිරීම හරහා තීරණ ගැනීමේ ආයතන වෙත සමාජ ගැටලු ගෙන එති.

- **සමාජ ගැටළු විසඳනු සඳහා පාර්ශ්වකරුවන්, අදාළ පුද්ගලයින් සහ ආයතන අතර හමුවීම් සඳහා පහසුකම් සැලසීම** - වෙනස් ප්‍රජාවන්ගේ දුක්ගැනවිලි එක්රැස් කිරීමෙහි ලා සිවිල් සංවිධාන බලපෑම් සහගත ක්‍රියාකාරීන් වෙති. රාජ්‍යය විසින් ආමන්ත්‍රණය කර නොමැති ගැටළු විසඳීම සඳහා ආණ්ඩුවේ බලධාරීන් සහ සාමාන්‍ය ජනතාව මුණගස්වන වටමේස සාකච්ඡා නිර්මාණය කරන්නේ සිවිල් සමාජ සංවිධානයි.

- **ආණ්ඩුව අධීක්ෂණයට ලක් කිරීම** - සිවිල් සමාජය ආණ්ඩුවේ ක්‍රියාවන් නිරීක්ෂණය කරන අතර අවශ්‍ය වූ විට එවැනි ක්‍රියා සහ විසඳුම් වලට විකල්ප සිවිල් ක්‍රියාමාර්ග පිළිබඳව ජනතාව දැනුවත් කරති.

- **පුරවැසිභාවීය ජීවිතය උත්තේජනය කිරීම සහ සිවිල් සංස්කෘතිය ප්‍රවර්ධනය කිරීම** - සිවිල් සමාජ සංවිධාන සිවිල් ක්‍රියාකාරීත්වය සඳහා ප්‍රතිමාන හා කොන්දේසි සකස් කරති.
- **තොරතුරු සොයා යැම සහ සමාජගත කිරීම** - සිවිල් සමාජ සංවිධාන සහ සාමූහිකයන් පොදු සම්පත්, රාජ්‍ය ප්‍රතිපත්ති සහ ඒවායින් සමාජයට වන බලපෑම පිළිබඳ තොරතුරු රැස් කරති. ඔවුහු ඒ තොරතුරු සාමාන්‍ය ජනතාව අතර ප්‍රචාරය කරති. මෙය මහජනතාවට අහිතකර ප්‍රතිපත්ති සංශෝධනය කිරීමට හෝ ප්‍රතිසංස්කරණයට උපකාරී වේ.

ප්‍රතිපත්ති ක්‍රියාවලිය තුළ සිවිල් සමාජ සංවිධානවල ඉහත කාර්ය භාරය ප්‍රතිපත්ති උපදේශනය සහ රාජ්‍ය ප්‍රතිපත්ති පිළිබඳව සමාලෝචනය සහ දැනුවත් කිරීම සඳහා සීමා වේ. කෙසේ වෙතත්, පසුගිය දශක කිහිපය තුළ සිවිල් සමාජ සංවිධාන මෙම සීමිත භූමිකාවෙන් ඔබ්බට ගොස් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන බවට ද පත් වී තිබේ.

- සමාජ හා ආර්ථික ප්‍රශ්න ආමන්ත්‍රණය කිරීම සඳහා සමාජයේ සියලුම කොටස් වෙත ළඟා වීමට මානව, භෞතික සහ මූල්‍ය සම්පත් සම්බන්ධයෙන් වර්තමාන රජයන්ට බොහෝ සීමාවන් තිබීම මෙයට හේතුවකි. මේ අනුව, රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා රාජ්‍ය නොවන සංවිධානවලට වැදගත් කාර්යභාරයක් ඉටු කළ හැකි බව වර්තමාන ලෝකයේ බොහෝ රජයන් හඳුනාගෙන ඇත. දිළිඳුකම පිටුදැකීම, සෞඛ්‍ය, පාරිසරික ආරක්ෂාව, දේශගුණික විපර්යාස යනාදී ක්ෂේත්‍රවල එවැනි රාජ්‍ය සහ රාජ්‍ය නොවන සංවිධාන අතර සහයෝගිතාව දෘශ්‍යමාන වේ.

- සමාජීය සහ දේශපාලනික වශයෙන් බැහැර කරන ලද සමාජ කොටස්වල ගැටළු ප්‍රතිපත්ති ක්‍රියාවලියට ගෙන ඒමේදී සිවිල් සමාජය වැදගත් කාර්යභාරයක් ඉටු කරයි - කාන්තාවන්, ආන්තික කුල කණ්ඩායම්, වාර්ගික සුළු ජාතීන් සහ දුගී ප්‍රජාවන් උදාහරණ වේ.
- ඇතැම් සිවිල් සමාජ සංවිධාන ආණ්ඩුවලට ආමන්ත්‍රණය කළ නොහැකි ගෝලීය ප්‍රතිපත්තිමය ගැටලු පවා ආමන්ත්‍රණය කර රට රටවල ජනතාව බලමුලු ගන්වා ඇත. උදාහරණයක් ලෙස, ගෝලීය උණුසුම, දේශගුණික විපර්යාස, මානව හිමිකම් උල්ලංඝනය කිරීම් ආදී ක්ෂේත්‍ර දැක්විය හැකි වේ.

නිගමනය (ලකුණු 02යි)

රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනයේ දී ව්‍යවස්ථාදායකය, විධායකය, අධිකරණය, යන රාජ්‍ය බලධාරීන් මෙන්ම දේශපාලන පක්ෂ මෙන්ම සිවිල් සමාජය ද විවිධ කාර්ය, විවිධ අවස්ථාවලදී සිදු කරති. ඒ අතරින්, මහජන නියෝජිතයින්ගෙන් සමන්විත වන ව්‍යවස්ථාදායකය මහජන පරමාධිපත්‍ය වෙතින් ලබා ගන්නා අධිකාර බලය එයට ප්‍රධාන හේතුව වේ. එසේ වුවත් ව්‍යවස්ථාදායකයේ එම බලය හා කාර්ය, විවිධ සාධක නිසා වෙනස් වී තිබේ. මේ අතර, සිවිල් සමාජය ද මහජන අභිලාෂ නියෝජනය කරමින්, ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට පමණක් නොව ප්‍රතිපත්ති පිළිබඳ විවාද වලට ද මහජන සහභාගීත්වය සහතික කිරීමට ද වැදගත් කාර්යයක් සිදු කරයි. මේ අනුව ව්‍යවස්ථාදායකය මෙන්ම සිවිල් සමාජය ද රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනයේ වැදගත් කාර්යයභාරයක් ඉටු කරති.

**(ලකුණු 15)**

**10. පහත සඳහන් ඕනෑම මාතෘකා දෙකක් පිළිබඳ ව කෙටි සටහන් ලියන්න.**

**(i) ගැටුම් සමථන ක්‍රියාවලිය**

(ලකුණු 10)

- ගැටුම් සමථනය සාමාන්‍යයෙන් දීර්ඝ ක්‍රියාවලියකි.
- ගැටුමක් සම්පූර්ණයෙන් විසඳීම දුෂ්කර වුවත්, ගැටුමකට සාධනීය ලෙස ප්‍රවේශ වීමේ මාධ්‍ය කිහිපයක්ම තිබේ. ඒවා නම් (අ) ගැටුම් ගැන කල් තබා අනතුරු ඇඟවීම, (ආ) ගැටුම් වැළැක්වීම, (ඇ) ගැටුම් කළමනාකරණය, (ඈ) ගැටුම් පරිවර්තනය, (ඉ) පශ්චාත් ගැටුම් සාමය ගොඩ නැගීම, සහ (ඊ) ගැටුම් සමථනය

(අ) ගැටුම් ගැන කල් තබා අනතුරු ඇඟවීම

මෙහි අරමුණ වන්නේ පැන නැගිය හැකි හෝ ගොඩ නැගෙමින් තිබෙන ගැටුම් හඳුනාගෙන, මුල් අවස්ථාවේදීම ඒවා වැළැක්වීමට පියවර ගැනීමයි. එය ගැටුම් පිළිබඳව දැක්විය හැකි වඩා ප්‍රශස්ත ප්‍රතිචාරයයි.

(ආ) ගැටුම් වැළැක්වීම

මෙහි අරමුණ වන්නේ මතුවිය හැකි ගැටලු, ඒවාට හේතු, ගැටුම් පැන නැගිය හැකි ස්ථාන සහ පාර්ශ්වකරුවන් කල්තියාම හඳුනාගෙන ඒවා පැන නැගීම වැළැක්වීමයි. නැතහොත් ගැටුම එහි මුල් අවධියෙහිදීම සමථනය කිරීමයි.

- ගැටුම් පිළිබඳ කල්තියා අනතුරු ඇඟවීම් හඳුනා ගැනීම මේ සඳහා අත්‍යාවශ්‍යය.
- ගැටුම් වැළැක්වීමේ ප්‍රවේශ දෙකක් තිබේ. ඒවා නම් (අ) ගැඹුරු වැළැක්වීම, සහ (ආ) සරල වැළැක්වීමයි.

(ඇ) ගැටුම් කළමනාකරණය

- මෙම සංකල්පයේ අර්ථ දෙකක් තිබේ.
- පළමුවන අර්ථය නම්, ගැටුමක් සමථනය කිරීමට දීර්ඝ කාලයක් ගතවිය හැකි නිසා එතෙක් සිටින්නේ නැතිව එම ගැටුමේ නිෂේධනීය ප්‍රතිඵල මුලදීම පාලනය කිරීමයි. ඒ නිසා මේ මගින් ගැටුමක හේතුවලට විසඳුම් සැපයෙන්නේ නැත.
- දෙවැනි අර්ථය නම්, පළමු වැනි අර්ථයේ දී මෙන් ගැටුමක් දෙස නිෂේධනීයව බලන්නේ නැතිව ගැටුමට සාමකාමීව ප්‍රකාශයට පත්වීමට ඉඩ සැළසීමයි. ගැටුමක් ඇති වන්නේ පාර්ශ්වකරුවන්ගේ අරමුණු අතර එකඟතාවක් ඇති නොවීම නිසා කළයුතු වඩාත් ප්‍රශස්ත දෙය වන්නේ එම ගැටුමෙහි සාධනීය විභවතාවන්ට ඉඩ සැළසීමයි. එසේ කළවිට එය ගැටුම සමථනයට තුඩුදිය හැකි වේ.
- මේ ප්‍රවේශ දෙකෙන්ම උත්සාහ ගැනෙන්නේ ගැටුම අර්බුදයක් බවට පත්වීම වැළැක්වීමයි.

(ඇ) ගැටුම් පරිවර්තනය

- ගැටුම් පරිවර්තනය වඩාත් අදාළ වන්නේ සිවිල් යුද්ධ, ජනවාර්ගික ගැටුම් වැනි සාර්ව සමාජීය ආර්ථික ගැටුම් වලටය. එවැනි ගැටුම් සාමාන්‍යයෙන් දිග්ගැස්සුණු සහ කල් පවත්නා ඒවාය.
- ගැටුම් පරිවර්තනය පිළිබඳ න්‍යායෙහි ඇති එක් උපකල්පනයක් නම් ඉහත ආකාරයේ දිග්ගැස්සුණු ගැටුම් ඒක පාර්ශ්වයක් ලබන ජයග්‍රහණයකින් පමණක් සාධනීය ලෙස විසඳිය නොහැකි බවයි. ඒ සඳහා ගැටුම අභ්‍යන්තරයෙන්ම පරිවර්තනය වීමේ ක්‍රියාවලියක් අවශ්‍ය වේ.
- මහාචාර්ය පීටර් වොලස්ටීන් පෙන්වා දී ඇත්තේ ගැටුම් පරිවර්තනය යනු ගැටුම් සම්බන්ධයෙන් ගොඩ නැගෙන අවබෝධය තුළින් ගොඩ නැගෙන ක්‍රියාදාමයක්ය යන්නයි. එබැවින් සාර්ථක ගැටුම් පරිවර්තනයක් සඳහා පහත සඳහන් ආකාරයේ වෙනස් වීම් සිදුවීම් අවශ්‍ය වේ. (අ) ගැටුමට සම්බන්ධ පාර්ශ්ව අතර, (ආ) ගැටුමට තුඩුදුන් හේතු සාධක සම්බන්ධව, (ඇ) ගැටුම තුළින් ඉටුකර ගැනීමට පාර්ශ්වකරුවන් අපේක්ෂා කළ අරමුණු සම්බන්ධව
- ගැටුම් පරිවර්තනය ආකාර කිහිපයකින් සිදුවිය හැකිය. ඒවා නම් (අ) පාර්ශ්වකරුවන් පරිවර්තනය වීම, (ආ) නිමිති සහ න්‍යාය පත්‍ර වෙනස් වීම, (ඇ) ගැටුමේ නීති රීති පරිවර්තනය වීම සහ (ඈ) ගැටුමේ ව්‍යූහමය පරිවර්තනය.

(ඉ) පශ්චාත් ගැටුම් සාමය ගොඩ නැගීම

- මෙය අදාළ වන්නේද ජන වාර්ගික ගැටුම්, සිවිල් යුද්ධ වැනි සාර්ව ගැටුම් සමථනය සම්බන්ධයෙනි.
- ඒ මගින් යෝජනා වන්නේ සාම ගිවිසුමක් අත්සන් කිරීම හෝ ගැටුමේ යුදමය පැත්ත අවසන් කිරීමෙන් සිදුවන්නේ ගැටුම සමථනය සඳහා අවශ්‍ය පූර්ව කොන්දේසි සැපයීම පමණක්ය යන්නයි. ඊට පසුව මතු වන්නේ ගැටුම යළි මතුවීම වැළැක්වීමේ අභියෝගය යි.
- මෙවැනි අභියෝග දෙආකාරයක් ගනී. (අ) මධ්‍යම කාලීන සහ දීර්ඝ කාලීන අභියෝග සහ ප්‍රතිපත්ති, (ආ) කෙටි කාලීන අභියෝග සහ ප්‍රතිපත්ති.
- මේවා අතර ප්‍රධාන වන්නේ ගැටුමට හේතු වූ මූල සාධක වලට ආමන්ත්‍රණය කෙරෙන ආර්ථික, සමාජ සහ දේශපාලන වශයෙන් යළි ගොඩ නැගීම සහ ප්‍රතිසංස්කරණයයි.

## (ii) ශ්‍රී ලංකාවේ විධායක ජනාධිපති ක්‍රමය පිළිබඳ විවේචන

(ලකුණු 10)

- 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, මුල පටන්ම දැඩි විවේචනයට ලක් වී ඇත. එම මූලික විවේචන මඟින් විධායක ජනාධිපති ක්‍රමයේ අඩුපාඩු ද අවධාරණය කරනු ලැබ තිබේ.
- මෙම විවේචන වලින් බොහෝ විට අවධාරණය කර ඇත්තේ එම ව්‍යවස්ථාවේ ඇති නිර්-ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යුහය යි.
- ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණය සහ දේශපාලනය යලි පිහිටුවීමට නම් 1978 ව්‍යවස්ථාවේ ඇති විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම හෝ ප්‍රතිසංස්කරණය කිරීම අත්‍යවශ්‍ය වන්නේය යන පුළුල් විශ්වාසය සිවිල් සමාජ සංවිධාන සහ සාමාන්‍ය පුරවැසියන් අතර මුල් බැසගෙන තිබෙන්නකි.
- මෙම විවේචන වලින් අවධාරණය කර ඇත්තේ පහත දැක්වෙන කරුණු වලටය.

i. සංවරණ සහ තුලන ක්‍රමයක් නොමැතිව තනි පුද්ගලයෙකු වටා බලතල විශාල ප්‍රමාණයක් එක්රැස් කර තිබීම.

ii. විධායක ජනාධිපති ධූරය රාජ්‍ය බලයේ කේන්ද්‍රීය ආයතනය වන අතර, එම ධූරය දරන්නා ආණ්ඩුවේ ඉතාම බලවත් පුද්ගලයා ද වෙයි. එහෙත් ඔහු / ඇය ප්‍රජාතන්ත්‍රවාදී සංවරණ - තුලන ක්‍රමයකට යටත් වන්නේ නැත.

iii. සෘජුවම ජනාධිපතිවරයා දේශපාලන විධායකයේ ජනාධිපතිවරයා වන අතර ඔහු / ඇය පත් වන්නේ මහජනයා විසින් වෙනම ඡන්දයකින් තෝරා ගැනීමෙනි. මෙයද ජනාධිපති ධූරයේ අසාමාන්‍ය බලයේ මූලාශ්‍රයකි.

iv. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 30 වැනි වගන්තියට අනුව ජනාධිපතිවරයා රාජ්‍ය නායකයා ද, විධායකයේ ප්‍රධානියා ද , ආණ්ඩුවේ ප්‍රධානියා ද, සන්නද්ධ සේවා වල ප්‍රධාන අණ දෙන නිලධාරියා ද වෙයි. මේ තරම් විශාල බලයක් දැරුවද ජනාධිපතිවරයාගේ බලතල වලට ආයතනික සීමා කිරීමක් නැත.

v. ජනාධිපතිවරයා පාර්ලිමේන්තුවට වගකිව යුතු වුවත්, ඔහු / ඇය කැබිනට් මණ්ඩලයේ ප්‍රධානියා වුවද, පාර්ලිමේන්තුවට උත්තර දීමට බැඳී නැත. කැබිනට් මණ්ඩලයට විරුද්ධව පාර්ලිමේන්තුවේ විශ්වාසභංග යෝජනාවක් සම්මත වුවත්, එය ජනාධිපතිවරයාට බලපාන්නේ නැත.

vi. පාර්ලිමේන්තුවේ තත්වය දුර්වල වීම, ලංකාවේ විදායක ජනාධිපති ක්‍රමයේ සෘජු ප්‍රතිඵලයකි.

vii. ව්‍යවස්ථාවට අනුව පාර්ලිමේන්තුව විසිරවීමේ බලය හිමිවන්නේ ද ජනාධිපතිවරයාට ය. මෙයද ව්‍යවස්ථාදායකය අභිභවා යන බලයක් ජනාධිපතිවරයාට ලැබෙන අවස්ථාවකි. පාර්ලිමේන්තුව කැඳවීම සහ වාර අවසාන කිරීමේ බලය තිබෙන්නේ ද ජනාධිපතිවරයාට ය. මෙම බලතල සමහර ජනාධිපතිවරුන් විසින් අවභාවිතා කිරීම මහජන විවේචනයට පාත්‍ර වී තිබේ.

viii. කැබිනට් මණ්ඩලය පත් කිරීම, අමාත්‍යවරුන් ධූරයෙන් ඉවත් කිරීම, අමාත්‍යවරුන්ට අමාත්‍යාංශ පැවරීම යන බලය තිබෙන්නේ ද ජනාධිපතිවරයාට ය. එහෙත් එම බලය අත්තනෝමතික ලෙස අවභාවිත කිරීම දැඩි විවේචනයට ලක් වී තිබේ.

ix. අධිකරණයේ ස්වාධීනත්වයට ඇඟිලි ගැසීම සම්බන්ධයෙන් ද, ජනාධිපතිවරුන් විවේචනයට ලක් වී ඇත.

x. මෙවැනි විවේචන නිසා විධායක ජනාධිපතිධූරය අහෝසි කළ යුතුය යන ප්‍රබල මතයක් ලංකාවේ ගොඩ නැගී තිබේ.

## (iii) ලෝක දේශපාලනයේ නව ප්‍රවණතා

(ලකුණු 10)

- ලෝකයට බලපෑ නව ප්‍රවණතා ගණනාවක්ම මෑත කාලය තුළ ලෝක දේශපාලනයේ ඇති වී තිබේ. ඒවා මෙසේ දැක්විය හැකිය.

1. බහු ධ්‍රැවීය බලතුලන ක්‍රමයක් බිහිවීම :

➢ දෙවැනි ලෝක යුද්ධයෙන් පසුව ඇමෙරිකා එක්සත් ජනපදය සහ සෝවියට් සංගමය අතර තිබූ ශීතල / නිරවි යුද්ධ සම්බන්ධතාව මත, ජාත්‍යන්තර සමාජයෙහි ද්වි ධ්‍රැවීය බල තුලන ක්‍රමයක් බිහිවිය. ඒ මත ලෝක ක්‍රමය පසමිතුරු බලකඳවුරු දෙකකට බෙදිණ. මෙය දැන් සම්පූර්ණයෙන් වෙනස් වී තිබේ.

➢ 1990 දී සිදු වූ සෝවියට් සංගමයේ බිඳ වැටීමෙන් පසුව, පශ්චාත් කොමියුනිස්ට් ලෝකය, ඒක ධ්‍රැවීය ලෝක ක්‍රමයක් කරා ගමන් කරන බවක් මුලදී පෙනිණ.

➢ 1990 ගණන් වලින් පසුව, ගෝලීය සමාජයේ නව රාජ්‍ය සන්ධාන බිහිවීම මගින් විකල්ප ලෝක ක්‍රමයක් බිහිවීම පටන් ගැනිණ. නැගෙනහිර ආසියාතික, ආසියාන් රටවල් ආර්ථික වශයෙන් ශක්තිමත් ජාතීන් ලෙස ඉදිරියට පැමිණියහ. ආසියානු රටවල් කලාපීය ආර්ථික බල හවුලක් ද වෙති. මේ අතර, යුරෝපයේ ආර්ථික සහ දේශපාලන බලයේ ප්‍රකාශනයක් ලෙස යුරෝපා සංගමය බිහි විය.

➢ BRICS රටවල් (බ්‍රසීලය, රුසියාව, ඉන්දියාව, චීනය සහ දකුණු අප්‍රිකාව) නව ආර්ථික බලවතුන්ගේ හවුලක් ලෙස බිහිවිය. ඒ අතර AUKUS (ඕස්ට්‍රේලියාව, බ්‍රිතාන්‍යය සහ ඇමෙරිකාව) රටවල්වල හවුලද QUAD (ආරක්ෂාව පිළිබඳ සිව් බලවතුන්ගේ සන්ධානය) ඇමෙරිකාව, ඉන්දියාව, ජපානය සහ ඕස්ට්‍රේලියාව නව බල හවුලක් ලෙස බිහිවිය.

➢ මේ අතර චීනය සහ රුසියාව වෙනම බල මධ්‍යස්ථාන ලෙස එකිනෙකට මිත්‍රව මතු වී සිටින අතර, ඒවා ඇමෙරිකානු සහ බටහිර යුරෝපීය යුධ ආධිපත්‍යය අභියෝගයට ලක් කරයි.

➢ මේ පසුබිම තුළ වර්තමාන ලෝකයේ ගෝලීය බල තුලනය බහු ධ්‍රැවීය රාමුවක් ලෙසින් වර්ධනය වී තිබේ.

2. **විකල්ප ජාත්‍යන්තර සම්බන්ධතා ජාල :**

➢ නූතන ලෝක ක්‍රමය තුළ තවත් වැදගත් ලක්ෂණයක් නම් ජාත්‍යන්තර වශයෙන් දේශපාලන හා සමාජීය ක්‍රියාකාරීත්වය රාජ්‍ය කේන්ද්‍රීය ක්‍රියාකාරීන්ගෙන් ස්වාධීනව සංවිධානය කරන විකල්ප බලවේගයක් ලෙස නව සමාජ ව්‍යාපාර වල ක්‍රියාකාරීත්වය ඉදිරියට යැමයි.

➢ ඔවුන් ලෝකය පුරා ජනතාව සංවිධානය කරන්නේ මානව අයිතිවාසිකම්, ස්ත්‍රී අයිතිවාසිකම්, පරිසරය ආරක්ෂාව කිරීම, ලිංගික සුළුතර ප්‍රජාවන්ගේ අයිතිවාසිකම් යනාදිය අරමුණු කරගෙනය.

- ගෝලීය උණුසුම් වීම නිසා මතුවන පරිසරය සම්බන්ධ නව අභියෝග, ජල හිඟය දීර්ඝ කාලීන නියඟ සහ මහා ගංවතුර වැනි ස්වාභාවික විපත්, ඒඩ්ස් හා කොවිඩ් වැනි වසංගත රෝග සහ සෞඛ්‍ය ප්‍රශ්න යන මේවා නව සමාජ ව්‍යාපාර ගෝලීය ක්‍රියාකාරීත්වයට යොමු කරවා ඇති නව සාධක වෙති.
- මෙවැනි නව සමාජ ව්‍යාපාර දැනට ලෝක දේශපාලනයේ සහ ප්‍රතිපත්ති පිළිබඳ විවාද වල ප්‍රධාන පෙළේ රාජ්‍ය නොවන ක්‍රියාකාරයකු වී තිබෙන්නේ එවැනි ආකාරයේ පසුබිමක් තුළය.

**3. ඇමෙරිකාව සහ චීනය අතර ඇති භූ දේශපාලනික තරඟය**

- නිරවි යුද්ධයෙන් පසු කාලය තුළදී ලෝකයේ දෙවැනි බලගතු රාජ්‍යය ලෙස චීනයේ නැගීම, ලෝකයේ පෙර පැවති බටහිර ආධිපත්‍යයේ පරිහානිය සමඟ සමාන්තරව සිදුවී තිබේ. මෙය වර්තමාන ලෝකයේ භූ දේශපාලනික වශයෙන් වැදගත් වෙනසක් සිදුකර ඇති වර්ධනයකි. මෙහි ප්‍රතිඵලය වී ඇත්තේ ගෝලීය වශයෙන් ආර්ථික හා යුදමය අතින් බලවත් මෙම රාජ්‍යයන් දෙක අතර පැවති තරඟය තියුණු වීමයි.
- චීනය තාක්ෂණික සහ යුදමය ක්ෂේත්‍රවල ශක්තිය වර්ධනය කර ගැනීමට දරණ ප්‍රයත්න නිසා රටවල් දෙක අතර තරඟය තවත් තියුණු වනු ඇත.

**4. යුක්රේනයේ ගැටුම**

- රුසියාව සහ යුක්රේනය එකිනෙකට එරෙහිව යුද ප්‍රහාර උත්සන්න කිරීමේ පසුබිම තුළ, යුක්රේන අර්බුදය තවත් තියුණු වීමට ඉඩ තිබේ. යුක්රේන අර්බුදයේ ප්‍රතිඵලයක් ලෙස මේ වන විටත් ලෝක සාමය අභියෝගයට ලක් වී තිබෙන අතර, ලෝක ආර්ථිකයට සහ ජාත්‍යන්තර වෙළඳාමට අහිතකර ලෙස එය බලපා තිබේ.
- මෙ අතර ආර්ථික අභියෝග සහ යුදමය පසුබෑම් මැද්දේ වුවත්, ඇමෙරිකානු සහ යුරෝපීය යුද බලයට අභියෝග කිරීමේ රුසියානු අධිෂ්ඨානය දුර්වල වී නැත.
- මෙ අනුව යුක්රේනියානු අර්බුදය රුසියාව සහ බටහිර රටවල් අතර සම්බන්ධතාවල විශාල පසුබෑමකට හේතු වී තිබේ. මෙම ගැටුම ඉක්මණින් අවසන් වන ලකුණු ද නැත.

5. ගෝලීය ආර්ථික පසුබෑම

- ගෝලීය ආර්ථික වර්ධනයේ වේගය අඩු වී ඇති අතර, බොහෝ රටවල් දැඩි ආර්ථික පසුබෑම් වලට ලක්වනු ඇතැයි ආර්ථික විශේෂඥයින් අනතුරු අඟවා ඇත.
- මෙම ආර්ථික අර්බුද පසුබිම තුළ බොහෝ රටවල ආදායම් බදු ඉහළ නංවා තිබේ. බොහෝ රටවල සේවා වියුක්තිය සහ අපරාධ ඉහළ යැමද සිදුවෙමින් පවතී.
- මෙම පසුබිම තුළ සමාජ අසහනය, මහජන විරෝධතා, උද්ඝෝෂණ, මහජනතාව සහ ආණ්ඩු අතර ගැටුම් සහ දේශපාලන අස්ථාවරභාවය පැතිරීම ලෝක දේශපාලන ප්‍රවණතාවක් වී තිබේ.

## (iv) ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණය සහ ශ්‍රී ලංකාවේ අත්දැකීම්

(ලකුණු 10)

- ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණය සම්බන්ධව තිබෙන්නේ ජයග්‍රහණ පසුබෑම් සහ නැවත මතුවීම යන මේවායින් සමන්විත මිශ්‍ර අත්දැකීම්වල වාර්තාවකි.
- ලංකාව නූතන ප්‍රජාතන්ත්‍රවාදයක් බවට පරිවර්තනය වීම ආරම්භ වූයේ බ්‍රිතාන්‍ය යටත් විජිත පාලන සමයේදී ය. 19 වැනි සියවසේ දී ඉතා සීමිතව නියෝජන මූලධර්මය හඳුන්වා දෙනු ලැබිණ. මේ අතර ආර්ථික හා සමාජීය ක්ෂේත්‍රවල ලිබරල්කරණය 1833 කෝල්බෲක් ප්‍රතිසංස්කරණ තුළින් ආරම්භ විය.
- 1931 ඩොනමෝර් ප්‍රතිසංස්කරණ ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදීකරණ ක්‍රියාවලියේ වැදගත් සන්ධිස්ථානයක් සළකුණු කළේය. එම ප්‍රතිසංස්කරණ වලින් සර්ව ඡන්ද බලය සහ සර්වජන ඡන්දයෙන් තෝරා පත් වූ ව්‍යවස්ථාදායකයක් ලංකාවට හඳුන්වා දෙන ලදි.
- සක්‍රිය සිවිල් සමාජයක් බිහිවීමට සමාන්තරව, පුරවැසියන්ගේ දේශපාලන පිබිදීමක් ද ඒ සමඟ වර්ධනය විය. ජාතික ව්‍යාපාරය සහ වෘත්තීය සමිති ව්‍යාපාරය යටත් විජිත ලංකාවේ සක්‍රිය සිවිල් සමාජයේ ප්‍රධාන දේශපාලන ව්‍යාපාර විය.
- 1947 සෝල්බරි ව්‍යවස්ථාවෙන් හඳුන්වා දෙන ලද්දේ මූලික වශයෙන්ම ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩු ක්‍රමයකි. නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය දිගටම පවත්වා ගෙන ගිය එය විසින් අලුත් ද්වි - මාණ්ඩලික ව්‍යවස්ථාදායකයක් ද, නීතියේ ආධිපත්‍ය ක්‍රමය ද ස්වාධීන අධිකරණයක් ද, සුළු ජන අයිතිවාසිකම් ආරක්ෂා කිරීම ද සීමිත ආණ්ඩුවක් ද ලංකාවට හඳුන්වා දෙන ලදි. එහෙත් සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයක් නොවීය. එය එම ආණ්ඩුක්‍රමයේ තිබුණ ප්‍රජාතන්ත්‍රවාදී අඩුවකි.
- 1970 ගණන් වන විට පෙනුණේ ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදි ක්‍රමය 1950 ගණන් වල මතුවූ සිංහල - දෙමළ ජාතිකවාදී උණුසුම තිබියදීත්, මැනවින් ක්‍රියාත්මක වූ වගයි.
- මෙම තත්වය 1970 ගණන්වල පටන් වෙනස් විය. මෙතෙක් කල් අප්‍රකාශිතව තිබුණු සමාජ හා දේශපාලන උණුසුම 1971 තරුණ කැරැල්ලෙන් අනපේක්ෂිතව ප්‍රකාශයට පත්විය.
- මේ අතර 1950 ගණන්වල සිට වර්ධනය වූ ප්‍රාදේශීය ස්වයං පාලනයක් ඉල්කක කර ගත් දෙමළ ජාතිකවාදී ව්‍යාපාරය, වෙන්වීමේ දේශපාලන ව්‍යාපාරයක් බවට පත්වූයේ 1970 ගණන් වලදී ය. ඉන් පසුව 1980 ගණන් වලදී එය සිවිල් යුද්ධයක් බවට පරිවර්තනය විය. 1980 ගණන් වලින් පසු කාලයේ සළකුණු වූයේ ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණයේ විශාල පසුබෑමකි.
- 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ද ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණය දුර්වල වීමට තුඩු දුන්නේය. ඒ මගින් සිදුවූයේ ලංකාවේ ආණ්ඩුක්‍රමය වෙස්ට්මින්ස්ටර් පාර්ලිමේන්තු ආකෘතියෙන් බැහැර වී විධායක ජනාධිපති ආණ්ඩුක්‍රමයට ක්‍රමයකට මාරු වීමයි.
- නව විධායක ජනාධිපති ක්‍රමය තුළ සිදුවූයේ ව්‍යවස්ථාදායකය විධායකය යටතට ගෙන ඒමයි. ජනාධිපතිවරයා ව්‍යවස්ථාදායකය ද, අධිකරණය ද පාලනය කළේය. විධායක ජනාධිපති ධූරය රාජ්‍ය බලයේ කේන්ද්‍රිය ආයතනය වූ අතර, එය සංවරණ සහ තුලන ක්‍රමයට අනුගත වූයේ

- මෙම ප්‍රජාතන්ත්‍රීය පසුබෑම් තිබියදීත්, 1978 ව්‍යවස්ථාවෙන් ආරම්භ වූ වැදගත් ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණයක් නම් පුරවැසියන්ට තම අයිතිවාසිකම් සහ නිදහස රැකගැනීම සඳහා අධිකරණයේ මැදිහත්වීමට ඉඩ සැලසූ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදය යි.
- මෙම ප්‍රජාතන්ත්‍රවාදී පසුබෑම් තිබියදී මතු වූ වැදගත් කරුණක් නම් සම්පූර්ණයෙන් අහෝසි නොවී නැවත මතුවීමට ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදයට තිබූ හැකියාවයි.
- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකාරවාදය, සිවිල් යුද්ධය, දේශපාලන ප්‍රචණ්ඩත්වය හා මිලිටරිකරණය මධ්‍යයේ වුවද ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදය අහෝසි වූයේ නැත. එය දුර්වල වූවා පමණි.
- ප්‍රජාතන්ත්‍රවාදී ආයතන නොනැසී දිගටම පැවතුණ අතර ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ ලංකාවේ මහජනතාවගේ විශ්වාසය ද අහෝසි නොවී දිගටම පැවතිණ. ප්‍රචණ්ඩත්වය සහ මැතිවරණ දූෂණ මාධ්‍යයේ වුවද, මැතිවරණ ආණ්ඩු මාරු කිරීමේ එකම මාධ්‍යය ලෙස දිගටම පැවතියේ ය. සිවිල් යුද්ධ මැද්දේ වුවද, ආණ්ඩු බලය මාරු වූයේ සාපේක්ෂ වශයෙන් සාමකාමීව ය.
- ප්‍රජාතන්ත්‍රවාදී ආයතන, වටිනාකම් සහ ක්‍රියාවලීන් සම්බන්ධව තිබුණු අඛණ්ඩ මහජන විශ්වාසය ප්‍රකාශයට පත් කරමින් මැතිවරණ වලදී මහජන සහභාගීත්වය ඉහළ මට්ටමකින් දිගටම පැවතින. ඒ සමගම ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ප්‍රතිසංස්කරණ සඳහා ප්‍රබල මහජන මතයක් ද සමාජය තුළින් ගොඩ නැගිණ.
- 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සහ එහි විධායක ජනාධිපති ක්‍රමය සංශෝධනය කිරීමත් ඒ වෙනුවට පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුවක් පිහිටුවීමත් මෙම ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යාපාරයේ ප්‍රධාන ඉල්ලීම විය.

## (v) ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තියේ මෑතකාලීන ප්‍රවණතා

(ලකුණු 10)

- මෑත කාලයේ දී ශ්‍රී ලංකාවේ විදේශීය ප්‍රතිපත්තියේ වෙනස්කම් සිදුවී තිබෙන්නේ ආණ්ඩු වෙන්සකම් ද සමග ය.
- 2015 වසරෙන් පසුව ලංකාවේ විදේශීය ප්‍රතිපත්තියේ පැහැදිලි වෙනස්වීම් සිදුවී තිබේ. එහි ප්‍රධාන ලක්ෂණය වන්නේ ආර්ථික රාජ්‍ය තාන්ත්‍රික සම්බන්ධතා විදේශ ප්‍රතිපත්තියේ විශේෂ නැඹුරුව වීමයි. මේ අනුව ලංකාවේ ද්වි පාර්ශ්වික මෙන්ම බහු පාර්ශ්වික විදේශ සම්බන්ධතා හැඩ ගැන්වීමට ආර්ථික සාධක බලපා තිබේ.
- ශ්‍රී ලංකාවේ වර්තමාන විදේශ ප්‍රතිපත්තිය ජාත්‍යන්තර ආර්ථික බලතුලනයට ප්‍රතිචාර දක්වන බව ද දක්නට ලැබේ. මේ ප්‍රවණතාව ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ලෝක බැංකුව, ලෝක වෙළඳ සංවිධානය (WTO) සහ ලෝක වෙළඳ සංවාද මණ්ඩපය (World Economic Form) සමග පවත්වනු කිට්ටු සම්බන්ධතා වලින් පෙනේ.
- මේ අතර යුරෝපීය සංගමය සහ චීනය වැනි නව ආර්ථික බලවතුන් මතුවීම නිසා අළුතින් සකස් වී ඇති නව ලෝක ආර්ථික බල තුලනයට ලංකාව අවධානය යොමු කරන බවක් ද පෙනේ.

Downloaded from Past Papers Wiki - Extensive collection of Past papers, Notes and much more!

- මේ අතර 2015 බලයට පැමිණි ආණ්ඩුවේ ආර්ථික විදේශ ප්‍රතිපත්තිය බටහිරට බර එකක් බව පෙනිණි. එසේ වුවත් එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව ඉන්දියාව සමඟ කිට්ටු ආර්ථික සහ දේශපාලන සම්බන්ධතා පවත්වා ගැනීමට කැමැත්ත දැක්වීය.
- පසුගිය ශ්‍රී ලංකා පොදුජන පෙරමුණු රජයේ විදේශ ප්‍රතිපත්තිය ආසියානු කලාපීය සහයෝගතාවට වැඩි නැඹුරුවක් දැක්විය. චීනය සමඟ කිට්ටු ආර්ථික සහ දේශපාලන සම්බන්ධතා පැවැත්වීම එහි ප්‍රතිඵලයක් විය. මෙයට සංස්කෘතික හා මතවාදී සාධක ද බල පෑවේය.
- මේ අනුව නිගමනය කළ හැක්කේ ශ්‍රී ලංකාවේ මෑත කාලීන විදේශ ප්‍රතිපත්තියේ ලක්ෂණයක් වී තිබෙන්නේ එය ලෝකයේ රටවල් සමඟ ඉදිරිගාමී අරමුණු සහිතව සම්බන්ධතා පවත්වා ගැනීමයි. එය ලෝකයේ ඇති භූ දේශපාලනික මෙන්ම කලාපීය දේශපාලන හා ආර්ථික වෙනස් වීම් පිළිබඳ යථාර්ථවාදී සහ වඩාත් කාලයට ගැලපෙන ඇස්තමේන්තු කිරීමක් මත සකස් කර තිබෙන්නක් බව නිරීක්ෂණය කළ හැකිය.

PAST PAPERS WIKI



PARCEL NO
LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් සඟරා | O/L ප්‍රශ්න පත්‍ර |
A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත් |
School Book ගුරු අතපොත්
PADANAMA PUBLICATION
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න